Sri Lanka Association for the Advancement of Science

SLAAS

78th Annual Sessions

Lay Abstracts

PROCEEDINGS OF THE
78TH ANNUAL SESSIONS

2022

Sri Lanka Association for the Advancement of Science

78th Annual Sessions
11 – 16 December, 2022

Lay Abstracts

Sri Lanka Association for the Advancement of Science – 2022

78th Annual Sessions

Lay Abstracts of Presented Work

11 – 16 December, 2022

© Sri Lanka Association for the Advancement of Science

2022 December

The material in this publication has been supplied by the authors, and only minor copy editing, if relevant, has been done by the SLAAS. The views expressed remain the responsibility of the named authors and do not necessarily reflect those of the SLAAS or any other organization or body sponsoring SLAAS activities.

Sri Lanka Association for the Advancement of Science
Vidya Mandiraya,120/10 Vidya Mawatha, Colombo 07, Sri Lanka
www.slaas.lk

Edited and compiled by: *Theshini Perera, Editor*

Sashiprabha M Vitharanarachchi, Assistant Editor

Section A

101/A

A urine-based new diagnostic approach for diabetic kidney disease

S. Saseevan[1,2], S. Rajapakse[2,3] and D.N. Magana-Arachchi[1*]

[1]*National Institute of Fundamental Studies, Kandy, Sri Lanka*
[2]*Postgraduate Institute of Science, University of Peradeniya, Peradeniya, Sri Lanka*
[3]*Department of Molecular Biology and Biotechnology, Faculty of Science, University of Peradeniya, Peradeniya, Sri Lanka.*

Diabetic kidney disease (DKD) is one of the major complications of Diabetes mellitus. Also, DKD is known as either structural or functional kidney damage that occurs due to diabetes mellitus. Nowadays, measuring the excreted amount of albumin (protein) in urine is an indicator for screening DKD. However, it has several laps, and usually, albumin appears in urine after kidney damage as a result of Diabetes. Therefore, discovering a non-invasive new diagnostic tool is essential for early diagnosis and prompt treatment to avoid the rapid worsening of the disease. This research aims to develop reliable and sensitive diagnostic tools for detecting DKD. Eighty-two urine samples were collected from healthy volunteers and chronic kidney disease (CKD) patients, including DKD. A molecule called RNA was extracted from the cells present in the urine samples. The quantitative polymerase chain reaction (qPCR) technique was used to study the expression pattern of ANXA3 and NGAL genes in DKD patients compared to healthy controls. These genes, NGAL and ANXA3, are related to the molecular mechanism of diabetes and kidney disease and were selected and underwent qPCR reactions. The RNA extracted from urine samples was converted into complementary DNA and used for PCR. The fold changes of each gene expression in DKD and other CKD patients were calculated using the relative quantification method. The results showed about four-fold increased NGAL expression compared with healthy controls was seen in DKD patients. It was not observed in other chronic kidney disease patients. Further, there was a two-fold increase in early stages of CKD than late-stage, indicating that NGAL could be used to detect the early stage of CKD. Additionally, the findings showed that a very high level of ANXA3 gene expression was found in DKD patients. It was nearly 783-fold and considered high compared with other CKD categories. From these findings of the research, ANXA3 and NGAL could be better non-invasive tools to diagnose the exact condition of DKD. However, it needs more samples to validate before applying for clinical trials.

*****dhammika.ma@nifs.ac.lk

101/A

சிறுநீர் மாதிரியல் உள்ள உயிர் மூலக்கூறுகளை பயன்படுத்தி நீரிழிவு நோயினால் ஏற்படக்கூடிய நாள்பட்ட சிறுநீரக நோயினை கண்டறிதல்

சு. சசீவன்[1,2], ச. ராஜபக்சே[2,3] மற்றும் டி. என். மங்கன ஆராச்சி[1]*

[1]தேசிய அடிப்படைக்கான கல்வி நிறுவகம், கண்டி, இலங்கை. [2]உயர் பட்டப்படிப்பிற்கான விஞ்ஞான நிறுவகம், பேராதனைப் பல்கலைக்கழகம், பேராதனை, இலங்கை. [3]மூலக்கூற்று உயிரியல் மற்றும் உயிர் தொழிநுட்ப துறை, விஞ்ஞானபீடம், பேராதனைப் பல்கலைக்கழகம், பேராதனை. இலங்கை..

நாள்பட்ட சிறுநீரக நோயானது மருத்துவ உலகிற்கு மிகப் பெரிய சவாலாகும். நாள்பட்ட சிறுநீரக நோய் ஏற்படுவதற்கு நீரிழிவு நோய் மிக முக்கியமான காரணி ஆகும். உலகலாவிய ரீதியில் ஏறத்தாழ முப்பது சதவீதத்திற்கும் அதிகமான நாள்பட்ட சிறுநீரக நோயினால் பாதிக்கபட்டவர்களிற்கு நீரிழிவு நோயே பிரதான காரணமாகும். விரைவாக நோய் நிலையினை கண்டறிவதும் உடனடி சிகிச்சை பெறுவதும் நீரிழிவுடனான நாள்பட்ட சிறுநீரக நோய் மோசமடைதலை தடுக்க உதவுகின்றது. சிறுநீரில் உள்ள அல்புமின் எனப்படும் புரதத்தின் அளவினை பரிசோதிப்பதன் மூலமாக நீரிழிவினால் ஏற்படுகின்ற நாள்பட்ட சிறுநீரக நோய் கண்டறியப்படுகின்றது. எனினும் அல்புமின் புரதமானது சிறுநீரில் தென்படுவதற்கு முன்னர் நீரிழிவினால் சிறுநீரகத்தியின் குறிப்பிட்ட பகுதி பாதிக்கப்படுகின்றது. எனவே இவ் அல்புமின் புரதப்பரிசோதனை நீரிழிவினால் ஏற்படக்கூடிய நாள்பட்ட சிறுநீரக நோயினை கண்டறிய போதுமானதாக இல்லை. எனவே இவ் ஆய்வின் மூலம் சிறுநீர் மாதிரியில் சாத்தியமானதும் நோயினை துல்லியமாக கண்டறியக் கூடியதுமான Biomarkers என்றழைக்கப்படுகின்ற உயிர் மூலக்கூறுகள் கண்டறியப்படுகின்றது. இவ் ஆய்விற்காக நீழிவினால் ஏற்படும் நாள்பட்ட சிறுநீரக நோயாளர்கள் உள்ளடங்கலாக நாள்பட்ட சிறுநீரக நேயாளிகள் மற்றும் சுகதேகிகள் உட்பட எண்பத்து இரண்டு பேரின் சிறுநீர் மாதிரிகள் சேகரிக்கப்பட்டுள்ளன. சிறுநீருடன் வெளியேறும், சிறுநீரகம் மற்றும் சிறுநீரகத்தியினையும் அதன் தொழிற்படு தன்மையையும் பிரதிபலிக்கின்ற கலங்களிலிருந்து ஆர்.என்.ஏ (RNA) எனப்படும் உயிர் பல்பகுதியம் பிரித்தெடுக்கப்பட்டு இவ் ஆய்விற்கு பயன்படுத்தப்பட்டுள்ளது. மூலக்கூற்று உயிரியலில் பயன்படுத்தப்படுகின்ற பீ.சி.ஆர் (PCR) தொழிநுட்பம் மூலம் ANXA3 மற்றும் NGAL ஆகிய இரு பரம்பரை அலகுகளின் வெளிப்படுதன்மை (gene expression) பரிசோதிக்கபட்டுள்ளது. சுகதேகியருடன் ஒப்பிடும் போது நீழிவினால் ஏற்படும் நாள்பட்ட சிறுநீரக நோயாளர்களின் உடலில் இவ் ANXA3 மற்றும் NGAL பரம்பரை அலகுகள் அல்லது உயிர்கூறுகள் மாற்றமடைகின்ற தன்மை இவ் ஆய்வின் மூலம் கண்டறிப்பட்டுள்ளது. NGAL எனப்படும் ஒரு உயிர் மூலக்கூறு நீரிழிவினால் ஏற்படும் நாள்பட்ட சிறுநீரக நோயின் கண்டறிதலில் மிக முக்கிய செல்வாக்குச் செலுத்துகின்றது. இவ் ஆய்வின் முடிவிலிருந்து சுகதேகியருடன் ஒப்பிடும் போது ஏறத்தாழ நான்கு மடங்கு NGAL மூலக்கூறின் வெளிப்படுதன்மை (gene expression)

அதிகமாக உள்ளதுடன் வேறு காரணிகளுடன் கூடிய நாள்பட்ட சிறுநீரக நோயாளர்களிடம் இவ் அதிகரிப்பானது அவதானிக்கப்படவில்லை. அதற்கு மேலதிகமாக பிந்திய நிலை நீரிழிவுடன் கூடிய நாள்பட்ட சிறுநீரக நோயாளர்களுடன் ஒப்பபிடும் போது முதல்நிலை நீரிழிவுடன் கூடிய நாள்பபட்ட சிறுநீரக நோயராாளர்களிடம் ஏறத்தாழ இருமடங்கிலும் அதிகமான NGAL மூலக்கூறின் வெளிப்படுதன்மை காணப்படுவதனால் NGAL ஆனது விரைவில் நீரிழிவுடன் கூடிய நாள்பட்ட சிறுநீரக நோயை கண்டறிய பயன்படுத்த முடியும். இதற்கு மேலதிகமாக ANXA3 எனப்படும் இன்னொரு உயிர் மூலக்கூறு நீரிழிவுடன் கூடிய நாள்பட்ட சிறுநீரக நோயாளர்களின் பரம்பரை அலகில் மிக அதிகமாக (ஏறத்தாழ 783 மடங்கு) காணப்படுவதுடன் வேறு காரணிகளினால் ஏற்படும் நாள்பட்ட சிறுநீரக நோயாளர்களின் சிறுநீர் மாதிரிகளில் இத்தகைய குறிப்பிடத்தக்க அதிகரிப்பு அவதானிக்கப்படவில்லை. ஆகவே இவ் ஆய்வின் முடிவிலிருந்து NGAL மற்றும் ANXA3 ஆகிய இரு உயிர் மூலக்கூறுகள் (Biomarkers) நீரிழிவினால் ஏற்படக்கூடிய நாள்பட்ட சிறுநீரக நோய் நிலையினை கண்டறிய பயன்படுத்த முடியும். எனினும் இன்னும் பல ஆய்வு மாதிரிகளை உள்ளடக்கி ஆய்வினை விரிவுபடுத்துவதன் மூலம் இவ் ஆய்வின் முடிவினை மேலும் வலுப்படுத்த முடியும்.

*dhammika.ma@nifs.ac.lk

102/A

The hepatoprotective capability of *Munronia pinnata* (*Binkohomba* plant)

S.D. Hapuarachchi[1*], T.S. Suresh[2], W.T.P.S.K. Senarath[3], S. Hadunnetthi[4] and K. Samarasinghe[5]

[1]Department of Ayurveda, Institute of Indigenous Medicine, University of Colombo [2]Department of Biochemistry, University of Sri Jayewardenepura, Sri Lanka.
[3]Department of Botany, University of Sri Jayewardenepura, Sri Lanka.
[4]Institute of Biochemistry, Molecular Biology and Biotechnology, University of Colombo [5]Department of Pathology, Faculty of Medical Sciences, University of Sri Jayewardenepura, Sri Lanka

According to the results of our research, it was confirmed that *Binkohomba* plant can prevent various diseases in the liver. The present study thus provides a scientific rationale for the traditional use of this herb in the management of liver disorders. It is scientifically proved by using an animal model. These results validated the use of both these herbs; *Binkohomba* and *Heen binkohomba* (*M. pinnata* and *A. paniculata*) as an alternative for *Swertia chiraita* plant (hepatoprotective agent) in the Traditional and Ayurvedic therapeutic practice as well as the Ayurvedic drug preparations in Sr Lanka. *Swertia chiraita* plant is not available in Sri Lanka. This research was carried out with the support of an animal model to check the ability of the different types of extracts of *Binkohomba* plant (*Munronia pinnata* Wall. Theob. Family -Meliaceae) and compared with the established Ayurveda hepatoprotective agent, *Andrographis paniculata*(AP) which is used in traditional Sri Lankan Medical system to prevent various diseases in the liver. *Binkohomba* plant has been used in a variety of ailments in the traditional Sri Lankan medical system and it has been happening for many centuries. Though it has been not documented in the Ayurveda text, Ayurveda doctors also used this plant as an alternative to *Swertia chiraita* plant. Therefore, we conducted this research work to find out the scientific validation for to use of this plant to prevent various diseases in the liver.

***dr.sdhapuarachchi@iim.cmb.ac.lk**

103/A

කිරීටක ධමනි බයිපාස් බද්ධය (බයිපාස් සැත්කම) සිදු කල ශල්‍ය රෝගීන්ගේ පෝෂණ තත්ත්වය කෙරෙහි රෝහලේ දී ලබා දෙනු ලබන පෝෂණ උපදේශනයේ බලපෑම නිර්ණය කිරීම

එම්. කේ. ඩී. ඕ. වරුණිකා සහ ඒ.එම්.එන්.ටී. අදිකාරි*

ව්‍යවහාරික පෝෂණ අධ්‍යන අංශය, පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය,
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල, 60170, ශ්‍රී ලංකාව

පෝෂණ උපදේශනය යනු මන්දපෝෂණය, නිදන්ගත රෝග සහ වෙනත් රෝගී තත්වයන්ට විශේෂයෙන්ම බෝ නොවන රෝග සඳහා තුඩු දෙන පෝෂණ අසමතුලිතතාවයන් මග හරවා ගැනීමට ආහාර පුරුදු සම්බන්ධයෙන් රෝගියා දැනුවත් කිරීමකි. කිරීටක ධමනි බයිපාස් බද්ධ කිරීමේ (CABG) සැත්කම් යනු හෘද රෝග සඳහා ප්‍රතිකාර කිරීම සඳහා බහුලව භාවිතා කරන ක්‍රමයකි. පෝෂණ උපදේශනය ශල්‍ය රෝගීන් ඉක්මණින් සුවවීමට ඉවහල් වන අතර සංකූලතා අඩු කරයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ බයිපාස් රෝගීන් කෙරෙහි පෝෂණ උපදේශනයේ බලපෑම පිළිබඳ සිදු කල අධ්‍යයනයන් සීමිතය. එබැවින් බයිපාස් සැත්කම සිදු කල රෝගීන්ගේ පෝෂණ තත්ත්වය කෙරෙහි පෝෂණ උපදේශනයේ බලපෑම නිර්ණයට මෙම අධ්‍යයනය සිදු කරන ලදී.අධ්‍යනය සිදු කෙරුයේ පෙර-පසු සැකැස්මක් භාවිතා කරමින් රෝගීන්ගෙන් ලබාගත් දත්ත විශ්ලේෂණය කිරීමෙනි. මීට 2021 ඔක්තෝබර් සිට නොවැම්බර් දක්වා මාස දෙකක කාලය තුළ පෞද්ගලික රෝහලකදී CABG ශල්‍යකර්මයට භාජනය වූ , වයස අවුරුදු 18 ට වැඩි රෝගීන් තිස් දෙනෙකු (පිරිමි; 20, ගැහැණු; 10) යොදා ගන්නා ලදී. ශල්‍යකර්මයෙන් පසු එක් එක් රෝගියාට රජයේ ලියාපදිංචි පෝෂණවේදියෙකු විසින් පෝෂණ උපදේශනය රෝහලේදී සපයන ලදී. රෝගීන්ට ලබා දුන් පෝෂණ උපදේශන නිරීක්ෂණය, පෝෂණවේදියාගෙන් ලබා ගත හැකි රෝගීන්ගේ තොරතුරු පත්‍රිකා සහ දුරකථනය හරහා පිලිතුරු ලබාගන්නා ප්‍රශ්නාවලියක් තොරතුරු රැස් කිරීමට භාවිතා කරන ලදී. ශල්‍යකර්මයට පෙර රෝගීන්ගේ සාමාන්‍ය තොරතුරු, වෛද්‍ය තොරතුරු, රුධිර සාම්පල වාර්ථා සහ ආහාර පුරුදු සම්බන්ධ තොරතුරු පිළිබඳ දත්ත රැස් කරන ලදී. ශල්‍යකර්මයෙන් පසු රෝහලට පැමිණි පලමු අවස්ථාවේදී රෝගීන්ගේ තුවාල සුවවීමට ගතවූ කාලය සහ රුධිර සාම්පල වාර්ථා ලබා ගන්නා ලදී. රුධිර සාම්පල වාර්ථා සහ ආහාර පුරුදු වෙනස් වූ ආකාරය සහ රෝගීන්ගේ තුවාල සුවවීමට ගතවූ කාලය භාවිතා කරමින් පෝෂණ උපදේශනයේ බලපෑම තීරණය කරන ලදී. පිළිවෙලින් රෝගීන්ගෙන් 20% ක් සහ 16.7% ක් රුධිරගත ග්ලූකෝස් මට්ටම් සහ මස්තු ඇල්බියුමින් (Serum Albumin) මට්ටම් ඉහළ මට්ටමේ සිට නිරෝගී මට්ටමක් දක්වා පත් කරගෙන ඇති බව රුධිර සාම්පල වාර්ථා මගින් තහවුරු විය. රෝගීන්ගෙන් 33.3% කගේ මස්තු ඇල්බියුමින් මට්ටම අඩු මට්ටමක සිට නිරෝගී මට්ටමකට පත් කරගෙන ඇත. රෝගීන්ගෙන් 36.7% කගේ තුවාල සුවවීමට ගතවූ කාලය (මධ්‍යන්‍ය සති 3.07 $\pm$ 1.2) සති දෙකකට වඩා අඩුය. රෝගීන්ගෙන් 33.3% ක් දිනක එළවළු පරිභෝජනය <2 servings සිට 2-4 servings දක්වා වැඩි කරගෙන ඇත. රෝගීන්ගෙන් 86.7% ක් ආහාර පිසීම සඳහා පළමු කිරි සිට දෙවන කිරි දක්වා පොල් කිරි වර්ගය වෙනස් කර ඇත. පර්යේෂණ අධ්‍යයනයේ ප්‍රතිඵලවලින් හෙළි වූයේ පෝෂණ උපදේශනය අධ්‍යයනයට සහභාගි වූ ශල්‍යකර්මයට භාජනයවූ CABG රෝගීන්ගේ පෝෂණ තත්ත්වය කෙරෙහි යහපත් බලපෑමක් ඇති කළ බවයි.

*namalithakshila@wyb.ac.lk

906/A

සාමාන්‍ය ශරීර ස්කන්ධ දර්ශකය (BMI) සහිත හෘදයාබාධ ඇති රෝගීන් අතර මධ්‍ය තරබාරුකමේ (central obesity) අවදානම් සාධක සහ මධ්‍ය ස්ථූලතාවයේ ප්‍රතිශතය හඳුනා ගැනීම

ජී.ජී.පී.එස්. රත්නසිරි සහ ඒ.එම්.එන්.ටී. අදිකාරි*

ව්‍යවහාරික පෝෂණ දෙපාර්තමේන්තුව, පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල, 60170, ශ්‍රී ලංකාව

මධ්‍ය තරබාරුකම /ස්ථූලතාවය **(central obesity)**, ශරීර ස්කන්ධ දර්ශකය (BMI) මගින් තීරණය කරනු ලබන තරබාරුකමට වඩා හෘදයාබාධ (MI) හොඳින් පුරෝකථනය කරයි. මධ්‍ය ස්ථූලතාවය (CO) සහිත සාමාන්‍ය BMI රෝගීන් අතර ඉහළ මරණ අනුපාතයක් දක්නට ලැබුණු බැවින්, මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ CO හි අවදානම් සාධක තීරණය කිරීම සහ සාමාන්‍ය BMI සහිත MI රෝගීන් අතර මධ්‍ය ස්ථූලතාවයේ ප්‍රතිශතය හඳුනා ගැනීමයි. 2021 අගෝස්තු සිට සැප්තැම්බර් දක්වා මාසයක කාලය තුළ කොළඹ පෞද්ගලික රෝහලකට ඇතුළත් වූ සහ සහභාගී වීමට කැමති MI රෝගීන් අධ්‍යයන නියැදිය ලෙස බඳවා ගන්නා ලදී. පෝෂණවේදියාගේ තක්සේරු ආකෘති භාවිතා කරමින් උස සහ බර මැනීම සහ පෝෂණය සම්බන්ධ තොරතුරු රැස් කරන ලදී. පූර්ව පරීක්ෂා කරන ලද සම්මුඛ පරීක්ෂක විසින් පරිපාලනය කරන ලද ප්‍රශ්නාවලියක් භාවිතා කරමින් සම්මුඛ සාකච්ඡා මගින් ආහාර පිළිබඳ තොරතුරු රැස් කරන ලදී. උපදෙස් සහිත වීඩියෝවක් ලබා දීමෙන් රෝගීන් ස්වයංව මනින ලද ඉණ වට ප්‍රමාණය (WC) ලබා ගන්නා ලදී. ආසියානුවන් සඳහා WHO කඩඉම් අගයන් සාමාන්‍ය BMI (18.5-22.9 kgm^{-2}) සහිත රෝගීන් තීරණය කිරීමට භාවිතා කරන ලදී. මධ්‍ය තරබාරුකම හඳුනා ගැනීම සඳහා කාන්තාවන් සඳහා WC >80cm සහ පිරිමින් සඳහා WC > 90cm භාවිතා කරන ලදී. SPSS 16.0 සංඛ්‍යානමය මෘදුකාංග පැකේජය භාවිතයෙන් සංඛ්‍යාන විශ්ලේෂණය සිදු කරන ලදී. MI රෝගීන් 30 දෙනෙකුගේ මධ්‍යනය වයස අවුරුදු 60.03±13.12 වන අතර බහුතරය (83%) පිරිමින් විය. සාම්පලයේ මධ්‍යනය උස, බර, BMI සහ WC පිළිවෙලින් 163.8 ±8.45 cm, 65.2 ±10.59 kg, 24.3±3.53 kgm^{-2} සහ 89.6 ±10.89 cm; (පිරිමි; 165.3±8.33cm, 66.3±10.90 kg, 24.3±3.46 kgm^{-2}, 91.6±9.73cm, ගැහැණු; 156.2±3.96 cm, 59.7±7.40 kg, 24.4±2.94 kgm^{-2},79.6±11.92 cm). මුළු රෝගීන් 30 දෙනාගෙන් රෝගීන් 15 දෙනෙකුට මධ්‍ය ස්ථූලතාවය (50%) තිබුණි. 9 (30%) පමණක් BMI හි සාමාන්‍ය පරාසයේ සිටි අතර රෝගීන් 4 (44.4%) මධ්‍ය ස්ථූලතාවයෙන් යුක්ත විය. පිෂ්ඨය සහිත ආහාර අධික පරිභෝජනය (p=0.009); එළවළු අඩු පරිභෝජනය (p=0.000); සීනි අධික පරිභෝජනය (p=0.025); මාළු පරිභෝජනය අඩු වාර ගණන (p=0.009); උදෑසන ආහාරය මඟ හැරීම (p=0.035) අධ්‍යයන නියැදියේ මධ්‍ය තරබාරුකම සඳහා ආහාරමය අවදානම් සාධක විය. ප්‍රතිඵල මගින් මත්පැන් පරිභෝජනය සහ මධ්‍යම තරබාරුකම අතර සම්බන්ධයක් අනාවරණය විය (p=0.035). ශ්‍රී ලංකාවේ MI රෝගීන් අතර මධ්‍ය ස්ථූලතාවය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම සඳහා පෞද්ගලික සහ රජයේ රෝහල්වල MI රෝගීන් පිළිබඳ වැඩිදුර අධ්‍යයනයන් අවශ්‍ය වේ.

*namalithakshila@wyb.ac.lk

105/A

ශලාය රෝගීන්ගේ මන්දපෝෂණය පිරික්සීමේ මෙවලමෙහි (MST) වලංගුභාවය

ඩබ්ලිව්.ඩබ්ලිව්.එල්.ඒ.එච්. වනිගසිංහ සහ ඒ.එම්.එන්.ටී. අදිකාරි*

ව්‍යවහාරික පෝෂණ දෙපාර්තමේන්තුව, පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල, 60170, ශ්‍රී ලංකාව

මන්දපෝෂණය පරීක්ෂා කිරීමේ මෙවලම (MST) යනු රෝගීන්ගේ මන්දපෝෂණය සහ පෝෂණ තත්ත්වය පිළිබඳ අවදානම තක්සේරු කිරීමේ මෙවලමකි. මෙම අධ්‍යයනය නිර්මාණය කර ඇත්තේ
ශලාය රෝගීන්ගේ මන්දපෝෂණය පිරික්සීමේ MST මෙවලමෙහි වලංගුභාවය හඳුනා ගැනීමයි. . රෝහල්ගත ශලාය රෝගීන්ගේ මන්දපෝෂණය සහ පෝෂණ තත්ත්වය පිළිබඳ අවදානම තක්සේරු කිරීම සඳහා අධ්‍යයනයක් කොළඹ පෞද්ගලික රෝහලකදී සිදු කරන ලදී. අධ්‍යයනය සඳහා වයස අවුරුදු 18ට වැඩි සහ සන්නිවේදන හැකියාව ඇති වැඩිහිටියන් බඳවා ගන්නා ලදී. පෝෂණවේදියාගේ තක්සේරු ආකෘති භාවිතා කරමින් උස සහ බර මැනීම සහ පෝෂණය සම්බන්ධ ජෛව රසායනික සහ වෛද්‍ය තොරතුරු රැස් කරන ලදී. කලින් පරීක්ෂා කරන ලද සම්මුඛ පරීක්ෂක විසින් පරිපාලනය කරන ලද ප්‍රශ්නාවලියක් භාවිතයෙන් දුරකථන සම්මුඛ සාකච්ඡා මගින් ආහාර පිළිබඳ තොරතුරු රැස් කරන ලදී. තෝරාගත් රෝහල, රෝහලට ඇතුළත් කිරීමේදී රෝගීන් සඳහා පරීක්ෂා කිරීමේ මෙවලම ලෙස MST භාවිතා කරයි. MST, මන්දපෝෂණ විශ්වීය පිරික්සුම් මෙවලම (MUST) සමඟ සංසන්දනය කරන ලදී. MUST යනු මන්දපෝෂණයෙන් පෙළෙන හෝ රෝහල්, ප්‍රජාවන් සහ අනෙකුත් සත්කාර සැකසුම් තුළ මන්දපෝෂණයේ අවදානමක් ඇති වැඩිහිටියන් හඳුනාගැනීම සඳහා වලංගු පරීක්ෂණ මෙවලමකි. ශලාය රෝගීන් සිය දෙනාගේ සාමාන්‍ය වයස අවුරුදු 56.84 ± 1.4 කි. MUST ට අනුව, රෝගීන්ගෙන් 73% ක් අඩු අවදානමක සිටි අතර 18% මධ්‍යස්ථ අවදානමක සහ 9% මන්දපෝෂණයේ ඉහළ අවදානමක් ඇත. MST ට අනුව, රෝගීන්ගෙන් 20% ක් අවදානමට ලක්ව ඇති අතර 80% ක් මන්දපෝෂණයේ අවදානමට ලක් නොවීය. MST හි 48.15% විශ්වාසනීය තාවයක් (95% විශ්වාසනීය පරතරය [CI] 46% සිට 34% දක්වා) සහ 90.41% (CI 81.24%-96.06%) හි අඩු සංවේදීතාවයක් තිබුණි. ධනාත්මක පුරෝකථන අගය 65% (CI 45.34%-80.61%) සහ සෘණ අනාවැකි අගය 82.5% (CI 76.49%-87.23%). 0.420 කප්පා සංගුණකය මගින් නියෝජනය වන පරිදි ගිවිසුම මධ්‍යස්ථ විය. MST සරල, ඉක්මන් සහ භාවිතා කිරීමට පහසු වුවද, අධ්‍යයනයේ සොයාගැනීම් වලට අනුව, රෝහල්ගත ශලාය රෝගීන්ගේ මන්දපෝෂණයේ අවදානම හඳුනා ගැනීම සඳහා එය සුදුසු පරීක්ෂණ මෙවලමක් නොවේ. ශලාය රෝගීන් සඳහා MST හි පිරික්සුම් සංරචක සඳහා පිළිගත හැකි සංවේදීතාවයක් නොමැතිකම, ශ්‍රී ලංකාවේ රෝහල්ගත කරන ලද ශලාය රෝගීන්ගේ මන්දපෝෂණය සහ පෝෂණ තත්ත්වය පිළිබඳ අවදානම තක්සේරු කිරීම තුළ එහි වලංගුභාවය තහවුරු කිරීම සඳහා MST භාවිතා කරමින් තවදුරටත් අනාගත පර්යේෂණයක් අවශ්‍ය බව යෝජනා කරයි.

*namalithakshila@wyb.ac.lk

106/A

Blood Meal Preferences of *Aedes aegypti* (Linnaeus) and *Ae. albopictus* (Skuse) in the District of Colombo

E.H.L. Perera[1], Y.I.N.S. Gunawardene[1*], M.D. Hapugoda[1], T. Ranathunge[2], L. Udayanga[3]

[1]Molecular Medicine Unit, Faculty of Medicine, University of Kelaniya, Sri Lanka.
[2]Department of Zoology, Faculty of Science, Eastern University, Sri Lanka
[3]Department of Biosystems Engineering, Faculty of Agriculture and Plantation Management, Wayamba University of Sri Lanka, Sri Lanka

Dengue has become a major health burden in Sri Lanka. Dengue is renowned as the fastest spreading mosquito borne viral infection, which is transmitted by *Aedes aegypti* and *Aedes albopictus.* These mosquitoes show varied behavioral patterns in the environment. Feeding preference is an important parameter of their behavior, which influence the vectorial capacity of them. In general, *Aedes* mosquitoes feed on a range of hosts for their blood meal including humans, cats, dogs, cattle, goats, rats and chicken etc. Despite the essential nature of this knowledge for vector control, the existing knowledge on the host preference is limited. Therefore, a comprehensive study was conducted in three selected dengue high risk MOH areas in the district of Colombo, namely Padukka, Kolonnawa and Maharagama. Female adult mosquitoes were collected from 25 households in each MOH area at a monthly interval for 11 months. Then, *Aedes* mosquitoes were identified, and the blood-fed female mosquitoes were used for the DNA extraction. The multiplex PCR method was used to identify the hosts of the blood fed mosquitoes. According to results, the preference of dengue mosquitoes on different blood sources represented significant variations ($P<0.05$). *Aedes aegypti* reported the highest preference for human blood, followed by dogs and cats. In the case of *Aedes albopictus* also, human blood accounted for the highest preference, and followed by the cow and cat. However, the least preference was for the dogs. A cluster analysis also revealed that the human blood is the most preferable blood meal for both dengue mosquito species, and blood meal from cow was preferred only by *Aedes albopictus.* In conclusion, this study has shown that the most preferrable host for the blood meals of the two *Aedes* species is human blood, while dog, cat and bovine hosts contributed less as hosts in the Colombo District of Sri Lanka.

***nilminisg@kln.ac.lk**

901/A

බහු ශාකමය සංයෝගයක් වන අග්‍රරාජ ක්වාථයෙහි අන්තර්ගත ශාක වල ඖෂධීය ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීම

එස්. එම්. ඩී. එන්. පී. සේනාරත්න*[1], වයි. ඒ. යූ. ඩී. කරුණාරත්න[2]

[1] *දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය, කොළඹ විශ්ව විද්‍යාලය*
[2] *දේශීය වෛද්‍ය විද්‍යායතනය, කොළඹ විශ්ව විද්‍යාලය*

ප්‍රජනක අවධියෙහි පසුවන කාන්තාවන් අතර සුලබව දක්නට ලැබෙන ගර්භාෂ බිත්තියෙහි හට ගන්නා පිළිකාමය නොවන රෝගයක් ලෙස ගර්භාෂගත අර්බුද හැඳින්විය හැක. මෙහි ප්‍රතිඵලයක් ලෙස කාන්තාවන්ගෙන් 25% - 50% ත් අතර ප්‍රමාණයක් ශල්‍ය ප්‍රතිකාර ලෙස ගර්භාෂගත අර්බුද ඉවත් කිරීමේ සැත්කම (Myomectomy) හෝ ගර්භාෂය ඉවත්කිරීමේ සැත්කම (Hysterectomy) සිදු කරගනී. අවම වශයෙන් වයස අවුරුදු 35ට වැඩි කාන්තාවන්ගෙන් 20% ක් ගර්භාෂගත අර්බුද වලින් පීඩා විඳින බව ගණන් බලා ඇත. තරුණ ක්‍රියාශීලී අවධියෙහි හට ගන්නා මෙම රෝගී තත්ත්වය නිසා කාන්තාවන්ගේ වැඩ කිරීමේ හැකියාවට මෙය අහිතකර ලෙස බලපා ඇත. එමෙන්ම අධික රුධිරවහනය, උදරයේ වේදනාව, කොන්දේ වේදනාව වැනි රෝග ලක්ෂණ කාන්තාවන්ගේ සමාජ, වෘත්තීය සහ මානසික යහපැවැත්මට බාධා ඇතිකරනු ලබයි. බටහිර වෛද්‍ය කර්මයෙහි මේ සඳහා ඖෂධ හා සැත්කම් විශාල ප්‍රමාණයක් ඇතිමුත් රෝගීන් සැත්කම් වලින් හටගන්නා අතුරු ආබාධ හා ඒ සඳහා යනු ලබන පිරිවැය මත ආර්ථික වශයෙන් ඇතිවන පීඩනය නිසා ඒ සඳහා යොමුවීමට මැලි වේ. එබැවින් මෙම සමාලෝචනයේ පරමාර්ථය වූයේ ගර්භාෂගත අර්බුද සෑදීමේ ක්‍රියාකාරීත්වය වළක්වන සහ මෙම රෝගී තත්ත්වයෙහි උපද්‍රවකාරී රෝග ලක්ෂණ අඩුකරන ශාකසාර ඖෂධීය ඔසුවක අඩංගු ඖෂධීය ශාක වල ක්‍රියා පිළිබඳ තොරතුරු සාරාංශගත කිරීමය. විවිධ සෙවුම් යන්ත්‍ර වල භාවිතයෙන් මෙම ශාක පිළිබඳ පෙර කරන ලද පර්යේෂණ, සාහිත්‍ය විමර්ෂණ උපයෝගීකර ක්‍රමානුකූලව සෙවීමක් සිදුකරන ලදී. මෙහි අන්තර්ගත අමුද්‍රව්‍ය ලබාගන්නා ශාක ලෙස පහත සඳහන් වීන අල (*Smilax glabra Roxb*), කොහොඹ (*Azadirachta indica juss*), කලුදුරු (*Nigella sativa Linn*), සූදුරු (*Cuminum cyminum*), එනසහල් ((*Elettaria cardamomum Maton*), කුරුඳු (*Cinnamamum zelanicum blume*), සාරණ (*Boehaavia diffuss Linn.*), ඉගුරු (*Zingiber offinale*), ගම්මිරිස් (*Piper nigram Linn*), තිප්පිලි (*Pipper longum Linn*), අසමෝදගම් (*Carum copticum Bentha Hook*), සහ කොත්තමල්ලි (*Coriandrum sativum*), හැඳින්විය හැක. මෙහි අඩංගු ශාක ඖෂධ 12 අතරින් ඖෂධීය අමුද්‍රව්‍ය හයක අන්තර්ගත ගර්භාෂගත අර්බුද ප්‍රතිකාරයේ රෝගියා සහ රෝගය කෙරෙහි ක්‍රියාකරන ආකාරය හා ක්‍රියාස්වාභාවය පිළිබඳ සමාලෝචනය කර සාකච්ඡා කරන ලදී. මෙම අධ්‍යනයේදී මේවායේ අන්තර්ගත ක්‍රියාකාරී ශාකමය රසායන (Phytochemicals), අක්මාව ආරක්ෂාකාරී (Hepato-protective), ප්‍රතිඔක්සිකාරක (Antioxidant), ප්‍රතික්ෂුද්‍රජීවී (Antimicrobial), ප්‍රතිඅර්බුද (Antitumor), ප්‍රතිප්‍රදාහ (Anti-inflammatory), සහ ප්‍රතිශක්තිකරණ ක්‍රියා (immunomodulatory activities) මගින්, මෙහි ගර්භාෂගත අර්බුයෙහි විශාලත්වය හා අර්බුද සංඛ්‍යාව අඩු කිරීමට හා එමෙන්ම ගර්භාෂගත අර්බුද රෝගය හා රෝග ලක්ෂණ කළමණාකරණය සඳහා ඵලදායී ලෙස භාවිතා කලහැකි නිසා, මෙම ඖෂධය රෝගියාගේ ජීවන තත්ත්වය උසස් කරන බව නිගමනය කළ හැක. මෙමගින් ගර්භාෂගත අර්බුද කෙරෙහි සංකූලතා ඇතිවීම පිළිබඳ සාක්ෂි අනාවරණය නොවුනි.

*nirmala.senaratna@gmail.com

902/A

Healthy dietary modification for a better life

K.D.S.P.N. Kathriarachchi and A.M.N.T. Adikari*

Department of Applied Nutrition, Faculty of Livestock, Fisheries, and Nutrition, Wayamba University of Sri Lanka, Makandura, Gonawila, 60170, Sri Lanka

Do you know the prevalence of Coronary Artery Disease (CAD) is increasing in an alarming rate in Sri Lanka? CAD is the narrowing of arteries due to the buildup of plaques in the walls of the arteries that may lead to heart attacks. Unhealthy diet is one of the major risk factors for developing CAD. We all know that prevention is better than cure. Therefore, healthy dietary modification is one of the best strategies to prevent and management of CAD. In this study, we assessed the dietary patterns, food preferences of the adults with CAD and adults at risk of developing CAD. The main objective of this study was to develop an educational e- resource including dietary menus for adults with CAD and adults at risk of developing CAD. This study was conducted in 3 phases in Kandy and Badulla districts. Under the first phase, assessed the dietary patterns and food preferences of the adults with CAD and adults at risk of CAD. It was a cross sectional study consisted with conveniently selected 15 CAD patients and 15 adults at risk of CAD. An interviewer administered questionnaire, food frequency questionnaire and 24 Hr dietary recalls were the data collection tools of this study. Observed the available and affordable food items for them. In the second phase determined the nutritional requirements for the adults with CAD and appropriate menus were developed. Those developed menus consisted of breakfast, lunch, dinner and 2 snacks. Then, those developed menus were evaluated by the experts in the nutrition to check the appropriateness. Under the phase 3, those developed and evaluated menus were compiled into an e -resource (blog) with serving sizes showing photos. The name of the developed blog is ‘Heart healthy menus for adults’. The developed blog is consisting with seven whole day dietary menus, energy ranged from 1100 kcal-1700 kcal. Finally, we can suggest that those developed menus can be used to reduce the risk of developing CAD in the Sri Lankan population.

Link of the Blog- https://hearthealthymenus.blogspot.com/2020/12/heart-healthy-menus-for-adults.html







Menu 1 Energy Requirement-1100 kcal			
Meal and Time	Food Item	Amounts in household units	
Bed Tea 6.30 a.m.	Non fat milk sugar	3 Teaspoons (15g) 1 Teaspoon(5g)	
Breakfast 8.00 a.m.	String Hoppers (Rice flour)	6 (medium sized)-60g	
	Plantain flower curry	3 tablespoons-45g	
	Dhal curry	2 tablespoons-45 g	
	Banana/Papaya/Mango	36g	
	Water	1 glass	
Mid morning snack 10 a.m.	Sweet potato(boiled)	½ of cup (36g)	
	Lunu miris	1 tablespoon(15g)	
Lunch 1.00 p.m.	Rice (brown) boiled	1 cup(120g)	
	Beans curry	3 tablespoons(66g)	
	Fish curry	1 medium sized piece(45g)	
	Broccoli curry	3 tablespoons(36g)	
	Carrot curry	3 table spoons(66g)	

*namalithakshila@wyb.ac.lk

104/A

Does previous infection of dengue impart disease severity in the current infection?

J.A.J.C. Jayarathne[1], G.K.D.L. Perera[1], Thusitha P. Muhandiramlage[1], D. Gunasekara[1] and C.W. Subasinghe[1*]

[1]Department of Biochemistry and Clinical Chemistry, Faculty of Medicine, University of Kelaniya, Ragama, Sri Lanka

Dengue is a colossal threat, especially in the subtropics and tropics of the world. It is spread through mosquitoes and four different, but closely related forms of viruses known as serotypes (DENV1, DENV2, DENV3, DENV4) cause the dengue infection. Clinical presentations vary from mild fever to severe forms of the disease known as dengue haemorrhagic fever (DHF), dengue shock syndrome (DSS), and expanded dengue syndrome. It is believed that a severe form of the disease is frequently associated when a person contracts the virus more than once and it is explained by a phenomenon known as antibody-dependent enhancement (ADE). However, other factors such as genetic differences of the host individuals and co-circulation of different viral types are thought to be playing a role. As the symptoms are similar to those of other fever-causing infectious diseases, the availability of dengue-specific laboratory diagnostics will enable clinicians to confirm the disease. In this study, we attempted to understand whether the previous infection of dengue has any impact on the disease severity and the differences of the serotypes in the current infection. We screened 689 patients with suspected-dengue fever from 2016-2019 who had presented at North Colombo Teaching Hospital, Base Hospital, Kiribathgoda, and District Hospital, Maligawatte. Colombo and Gampaha districts were the major- hot spots for dengue infection during this period. It was recorded that 129 individuals were suffering from dengue infection and type- 2 infection was the predominant serotype each year from 2016 to 2019. Furthermore, type-1 infection was observed more frequently in 2016 and 2019. The majority of the individuals who had contracted the virus for the first time (primary infection) and less percentage of patients who acquired the disease previously (secondary infection) were suffering from dengue fever. In conclusion, there was a likelihood of having dengue fever in the individuals with primary infection than the secondary infection. However, there was no association between the disease severities with either primary or secondary infection. Furthermore, there was no relationship between the disease severities with the type of the virus. Therefore, our findings become an eye-opener for having a systematic-laboratory diagnosis in the country.

***cwsubasinghe@kln.ac.lk**

903/A

තල වල ඖෂධීය බලපෑම්;ක්‍රමානුකූල සමාලෝචනය

එස්. එච්. කේ. දීප්තිකා[1*], කේ.පී.කේ.ආර්. කරුණාගොඩ[2],පී.කේ.පෙරේරා[3]

[1*]කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යනාංශය, දේශීය වෛද්‍ය පීඨය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, යක්කල. [2] ප්‍රසූති තන්ත්‍ර කෞමාරභෘත්‍ය අංශය, දේශීය වෛද්‍ය විද්‍යායතනය, කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය [3]දේශීය වෛද්‍ය විද්‍යායතනය, කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය

තල යනු ලොව පැරණිතම තෛල අඩංගු බීජ සහිත බෝග වලින් එකකි. එය ලොව පුරා පෝෂණ සංඝටකයක්, ඖෂධයක් මෙන්ම කාර්මික අමුද්‍රව්‍යයක් ලෙස ද භාවිතා වේ. කළු තල, සුදු තල හා රතු තල ලෙස වර්ග තුනකි. තල, ශ්‍රී ලංකාව තුල සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයේ සහ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ බහුලව භාවිත වේ. තල දඬු, කොළ, බීජ සහ තෙල් වල ඖෂධීය වටිනාකම් ඇත. 2011 ජනවාරි සිට 2022 මැයි මාසය අතර කාලයේ දී පිළිගත් පර්යේෂණ දත්ත සමූහයන් තුල ප්‍රකාශයට පත්කර ඇති පර්යේෂණ පත්‍රිකා භාවිතා කරමින්, ක්‍රමානුකූල සමාලෝචනයක් සහ විශ්ලේෂණයක් ලෙස, පිළිගත් විද්‍යාත්මක ක්‍රමයක් භාවිතා කරමින් මෙම අධ්‍යයනය සිදුකර ඇත. පර්යේෂණ පත්‍රිකා සෙවීමේ දී සෙවුම් පද භාවිතා කළ අතර ඇතුලත් කිරීමේ හා ඉවත් කිරීමේ නිර්ණායකයන්ට යටත්ව පත්‍රිකා තෝරා ගැනීම සිදුකර පසුව අනුපිටපත් ඉවත් කරන ලදී. තෝරාගත් පත්‍රිකාවන්ගේ සාරාංශ කියවීමෙන් වඩාත් අදාළ ලිපි තෝරා ගැනීමෙන් පසු අවසාන අදියරේ දී සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා කියවා ඖෂධීය ක්‍රියාකාරීත්වය, නිස්සාරණයේ වර්ගය, ශාකයේ භාවිතා කල කොටස, පර්යේෂණ ක්‍රමවේදය ආදිය ඇතුලත් වන පරිදි දත්ත රැස්කර විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව අවසානයේදී තෝරාගත් ලිපි 30 ක් සමාලෝචනය කළ අතර, එයට සායනික පර්යේෂණ 8 ක්, සජීවී සෛල තුල සිදුකල පර්යේෂණ 11 ක්, සහ අජීවී පරිසරය තුල සිදුකළ පර්යේෂණ 15 ක් ඇතුළත් විය. තල වල අන්තර්ගත පිළිකා නාශක ක්‍රියාකාරීත්වය, ප්‍රති ඔක්සිකාරක ක්‍රියාකාරීත්වය, ප්‍රති බැක්ටීරියා ක්‍රියාකාරීත්වය, වේදනා නාශක ක්‍රියාව, අසාත්මිකතා නාශක ක්‍රියාකාරීත්වය, ඔසප් රුධිර වහනය ඇතිකිරීමේ ක්‍රියාකාරීත්වය, ස්නායු ආරක්ෂක ක්‍රියාකාරීත්වය ආදී ඖෂධීය ක්‍රියාකාරීත්ව රැසක් විද්‍යාත්මකව සනාථ කර තිබෙන බව මෙමගින් තහවුරු විය.

*krishanid@kln.ac.lk

904/A

Changes in MTHFR gene; the cause for many diseases

A. Chandrasekaran* and G.H.R.E. Karunaratne

Faculty of Science, Horizon Campus, Malabe, Sri Lanka

Many enzymes are involved in the breaking down of a common molecule in human body, called folate. The methylenetetrahydrofolate reductase (MTHFR) is one such important enzyme involved in this process. This enzyme is produced by the gene called *MTHFR*. Changes occurring in *MTHFR* gene reduce the proper functioning of the MTHFR enzyme. Faulty enzyme can affect the folate breakdown. This can disturb the biological process called DNA methylation occurring inside our body. Faulty enzyme can also produce higher levels of homocysteine in blood, which is an amino acid. This may result in many diseases. Many scientists have studied how these changes lead to diseases. Two common changes in MTHFR gene which affect the enzyme function have been found by scientists. They are named as the A1298C polymorphism and C677T polymorphism. Our aim was to get an understanding on how these changes lead to disease like autism, rheumatoid arthritis, migraine, breast cancers, psychiatric disorders and pregnancy issues. We collected and studied research done in the past about changes in *MTHFR* gene in different ethnic groups. We found that, than A1298C the C677T polymorphism is related with many of these diseases. C677T polymorphism increases the risk of autism, rheumatoid arthritis, migraine, pregnancy issues and psychiatric illnesses like depression and bipolar disorders. Both C677T and A1298C *MTHFR* polymorphisms equally increase the risk of breast cancer. The two polymorphisms lead to breast cancer by disturbing the DNA methylation and cause other afore mentioned health conditions by increasing homocysteine level. In people who have these altered MTHFR genes, additional folate intake might reduce their risk of developing these diseases. In future more research should be done on *MTHFR* gene alterations and how it is related to these health issues. This will help in developing specific and improved treatments for treating these conditions. Further research should also try to improve the activity of MTHFR enzyme in people who have altered MTHFR genes.

*****chandrasekarana@horizoncampus.edu.lk

905/A

Antidiabetic potency of family Aristolochiaceae: A review

K.H.R.L.G. Piyathilaka and G.H.R Eranga Karunaratne

Faculty of Science, Horizon Campus, Malabe Sri Lanka

The plant species in the family Aristolochiaceae consist of various important bioactive compounds, and they are used as functional ingredients in the development of drugs to act against diseases including diabetes. Diabetes mellitus is a group of related diseases in which the blood sugar is not regulated by the body. This review focuses on identifying the glucose-lowering potencies regarding the diabetic mellitus of plant species in the family Aristolochiaceae. This was done by conducting literature research between the years 2008 to 2020 using the database Google Scholar and PubMed. The antidiabetic potency was evaluated by using alpha-glucosidase inhibition in alpha-glucosidase inhibitory assay, alpha-amylase dehydrogenase rate in alpha-amylase inhibitory assay, and glucose reduction in the diabetic rat model. Alpha amylase and alpha glucosidase are helpful to manage hyperglycemia because they delay the digestion of carbohydrates, which lowers the blood glucose level. In the diabetic rat model, root ethanolic extract of *Aristolochia ringens* showed the highest glucose reduction with the Streptozotocin (STZ) diabetogenic agent which is 113.1±1.8 mg/dl. A substance that consistently raises blood glucose levels to within the ranges known as diabetogenic agent. The leaves ethanol extract of *Aristolochia indica* showed the highest glucose reduction with the alloxan diabetogenic agent which is 5.28±0.37 mg/dl. When using dexamethasone as a diabetogenic agent, methanolic extract of the whole plant of *Aristolochia bracteolata* showed the highest glucose reduction which is 124.5±1.231 mg/dl. In α- glucosidase inhibitory assay, ethyl acetate root extract of *Aristolochia longa s*howed the highest IC50 value which is 0.199±0.014 mg/ml. In the α-amylase inhibitory assay, whole plant methanolic extract of *Aristolochia indica* showed the highest α-amylase dehydrogenase rate which is 60.12 ±0.46 nm/min/mg protein. The genus *Aristolochia* in the family Aristolochiaceae was showed significant diabetes potency. Moreover, the importance of using species in the family Aristolochiaceae in the management of diabetes should be identify and accept to suitable alternative medicines in future studies.

***Rashmi.layanga5@gmail.com**

Section B

201/B

ඉදුණු දෙළුම්හි රසායනික ගුණාත්මය අභිබවමින් පෙරට පැමිණි විශ්මිත නොමේරූ දෙළුම්

පී.එස්.අයි.යූ. ජයරත්න[1], ඩී.සී. අබේසිංහ[1*], ආර්.ඒම්. ධර්මදාස[2] සහ එස්.බී.ඒ. වීරවර්ණ[3]

[1]කෘෂිකර්ම හා වැවිලි කලමණාකරණ අධ්‍යයනාංශය, කෘෂිකර්ම හා වැවිලි කලමණාකරණ පීඨය,
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල.
[2]කාර්මික තාක්ෂණ ආයතනය, කොළඹ 07.
[3]කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, කල්පිටිය.

බොහෝ දෙනෙකු ප්‍රිය කරන දෙළුම්, ප්‍රකට පලතුරකි. මෙය රෝග නිවාරණයට ගන්නා වටිනා ඖෂධයකි. ශ්‍රී ලංකාවේ, වර්තමානයේ "කල්පිටිය-හයිබ්‍රිඩ්", "නිමාලි", "දයා" හා "නයන" යන දෙළුම් ප්‍රභේද හතර වගා කෙරෙන අතර මඳුළු රත් පැහැති "කල්පිටිය-හයිබ්‍රිඩ්" ප්‍රභේදයේ ඵලාවරණය තැඹිලි-රෝස පැහැතිය. කහ පැහැති ඵලාවරණයක් සහිත නිමාලි සහ දයා ප්‍රභේද වල මඳුළු රෝස පැහැවේ. නයන ප්‍රභේදයේ ඵලාවරණය ලා රෝස පැහැති වන අතර එහි මඳුළු වල රෝස පැහැය දයා සහ නිමාලි ප්‍රභේදවලට සාපේක්ෂව තීව්‍රවේ.

ඉහළ ඖෂධීය වටිනාකමක් ඇති දෙළුම්, පුරාණ හෙල වෙදකම තුළ යම් යම් රෝගාබාධ, විශේෂයෙන්ම උදරාබාධ, අතීසාරය වැනි ආමාශයික රෝග සහ ඩෙංගු වැනි රුධිරගත රෝග නිවාරණයට යොදාගෙන තිබෙන අතර සුවිශේෂත්වය වන්නේ මෙහිදී නොමේරූ දෙළුම් යුෂ (මසක් පමණ වයසැති) හා මී පැණි සංකලනයක් යොදා ගැනීමයි. ජනතාව ප්‍රධාන වශයෙන් භාවිතයට ගන්නා ඉදුණු දෙළුම් භාවිතයට නොගෙන, නොමේරූ දෙළුම් හෙළ වෙදකම තුළදී යොදා ගැනීම කුතුහලයට කරුණකි. එබැවින් මෙහි විද්‍යාත්මක සත්‍යතාව සෙවීමට දෙළුම් වල රසායනික ගුණාත්මය (ප්‍රතිඔක්සිකාරක ගුණය) එහි වර්ධන අවධි අනුව කෙසේ වෙනස්වේද යන්න උක්ත සියලුම දෙළුම් ප්‍රභේද ආශ්‍රයෙන් නිර්ණය කරන ලදි. එහිදී මාස එකක (නොමේරූ දෙළුම්), මාස දෙකක, මාස තුනක හා මාස හතරක (ඉදුණු දෙළුම්) ලෙස වර්ධන අවධි හතරක පවතින දෙළුම් වල රසායනික ගුණාත්මය පරීක්ෂණාත්මකව නිර්ණය කරන ලදී.

විශ්මයට කරුණ නම්, නොමේරූ දෙළුම්ඵල වල ඉතා ඉහළ රසායනික ගුණාත්මයක් අනෙක් වර්ධන අවධි අභිබවා වාර්තා වීමත්, මෙකී රසායනික ගුණාත්මය එහි වර්ධනයත් සමග ක්‍රමයෙන් හීන වී යන බවත් නිරීක්ෂණය වීමයි. එබැවින් නොමේරූ දෙළුම් හා සසඳන කල ඉදුණු දෙළුම්වල අඩු රසායනික ගුණාත්මයක් වාර්තා විණි. එනම් හෙළ වෙදකම තුළ රෝග නිවාරණයට නොමේරූ දෙළුම් යොදා ගැනීම තවදුරටත් නොරහසකි. එසේම මෙහිදී විවිධ වර්ධන අවස්ථා වල පවතින දෙළුම් වල ඵලාවරණය හා මඳුළුවල රසායනික ගුණාත්මයද නිර්ණය කරන ලද අතර එහිදී මඳුළු සතුව ඉතා අඩු රසායනික ගුණාත්මයක් ඵලාවරණයට සාපේක්ෂව පවතින බවද අනාවරණය විය. එසේම, ඵලාවරණයේ/ මඳුළු වල පැහැයේ තීව්‍රවීම ඒවායෙහි රසායනික ගුණාත්මය කෙරෙහි ඍජු සම්බන්ධතාවයක් නොමැති බවද මෙහිදී වාර්තා විය. මන්දයත්, ලා රෝස පැහැති මඳුළු සහිත නිමාලි ප්‍රභේදය අනෙකුත් ප්‍රභේද තුන අභිබවා ඉහළම රසායනික ගුණාත්මයක් පෙන්වීමයි.

මේ අනුව දෙළුම් ඵලයේ නොමේරූ අවස්ථාවේ ඉහළම රසායනික ගුණාත්මයක් පවතින බවත් වර්ධනයත් සමග එහි රසායනික ගුණාත්මය ක්‍රමයෙන් අඩුවී යන බවත් මඳුළු හා සසඳන කළ ඵලාවරණයේ ඉහළ රසායනික ගුණාත්මයක් පවතින බවත් ඵලාවරණයේ/ මඳුළු වල පැහැයේ තීව්‍රවීම ඒවායෙහි රසායනික ගුණාත්මය කෙරෙහි ඍජු සම්බන්ධතාවයක් නොමැති බවත් මෙම පර්යේෂණය මගින් තහවුරු වී ඇත. එබැවින් අනාගතයේ විවිධ රෝග නිවාරණයට නොමේරූ දෙළුම් හා ඵලාවරණය ආශ්‍රයෙන් නව ඖෂධීය නිෂ්පාදන බිහි වීමට මෙම පර්යේෂණ ප්‍රතිඵල මහත් පිටුවහලක් වනු නොඅනුමානය.

*abeysinghedc@yahoo.com

202/B

ඖෂධීය ගුණයෙන් අනූන පහතරට තේ දල්ල

එස්.ඒ. වික්‍රමරත්න[1] , එම්.එම්. නිපුනිකා[1] , ආර්.ඒ.ඒ.පී. මාරපන[1] , ඩී.වී.සී. අබේසිංහ[2] සහ ඩී.සී. අබේසිංහ[1*]

[1]කෘෂිකර්ම හා වැවිලි කලමණාකරණ අධ්‍යයනාංශය, කෘෂිකර්ම හා වැවිලි කලමණාකරණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකදුර, ගෝනවිල.
[2]ආහාර විද්‍යාව හා තාක්ෂණ අධ්‍යයනාංශය, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

තේ පානය නිෂ්පාදනය කරන්නේ *Camellia sinensis* නම් විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන තේ ශාකයෙන් නෙළා ගත් ළපටි දළු භාවිතයෙනි. වර්ෂ 1867 බ්‍රිතාන්‍ය ජාතික ජේම්ස් ටේලර් මහතා විසින් ශ්‍රී ලංකාවට වාණිජමය වශයෙන් හඳුන්වා දුන් මෙම බෝගය අද වන විට ප්‍රධාන වැවිලි බෝගයක් වී හමාරය. එවක පටන් මේ දක්වා ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වල තේ ප්‍රභේද වගා කරමින් අප ආර්ථිකය ශක්තිමත් කිරීමට මහත් රුකුලක් වෙමින් පවතී.

භූ විෂමතාව අනුව ශ්‍රී ලංකාවේ තේ වගාව කොටස් තුනකට වර්ග කර දැක්විය හැකි අතර ඒවා නම් උඩ රට තේ (1,200 m ට ඉහල උස් බිම්වල තේ වගාව), මැද රට තේ (මුහුදු මට්ටමේ සිට 1200 m ත් 600 m ත් අතර බිම්වල තේ වගාව) හා පහත රට තේ (600 m ට වඩා පහළ බිම්වල තේ වගාව) යනුවෙනි. විවිධ තේ ප්‍රභේද ඒවා වගා කරන ප්‍රදේශයෙහි දේශගුණික තත්ත්වය මත, තේ දල්ලෙහි ගොඩනැගෙන රසායනික සංඝටක ද වෙනස් වීමේ හැකියාවක් ඇත. මේ පිළිබඳ දැනට පවතින දත්ත අල්ප බැවින් නව දැනුම ෙසායා යාමේ අරමුණින් ශ්‍රී ලංකාවේ උඩරට, මැද රට හා පහත රට තේ යායවල් වලින් නෙළා ගත් නැවුම් තේ දළු වල ffජව රසායනික සංඝටක හා ප්‍රතිඔක්සිකාරක ධාරිතාව සංඛ්‍යාත්මකව මැන බැලීමේ පරීක්ෂණයක්, පරීක්ෂකයන් කණ්ඩායමක් විසින් සිදුකොට ඇත. ඒ සඳහා ඉහත සඳහන් ප්‍රදේශ තුනෙහි බහුලව වගා කරන තේ ප්‍රභේද 5ක් (TRI 2023, TRI 2043,TRI 3072, TRI 4006, සහ TRI 4052) fයාදා fගන ඇති අතර ඒවාතේ පවතින ෆීනෝල ප්‍රමාණයත්, ෆ්ෙල්වෙනායිඩ ප්‍රමාණයත්, ප්‍රතිඔක්සිකරණ ධාරිතාවයත් මැන බලා ඇත.

එහි දී ලද ප්‍රතිඵල වලින් හෙළි වූයේ පහත රටින් නෙළාගත් තේ දළු වල අන් භූවිෂමතා කොටස් දෙකෙන් ගත් දළු වලට වඩා මෙම රසායනික සංඝටක බහුලව පවතින බවයි. මේ අතර උඩරටින් නෙළා ගත් TRI 3072 හා TRI 4052 ප්‍රභේදයේත්, මැද රටින් තනළා ගේ TRI 2043 ප්‍රභේදයේත්, පහත රටින් නෙළා ගත් TRI 2023 ප්‍රභේදයේත්, ඒ ඒ කලාපයන්ට අදාල ඉහළ ප්‍රතිඔක්සිකාරක ගුණයන් දක්නට ලැබුනි. එම රසායනිකයන්ගේ වැදගේකම වනුයේ වයස් ගත වීමත් සමඟ ඇති වන පිළිකා, හෘද රෝග, දියවැඩියාව, අධි රුධිර පීඩනය වැනි රෝගාබාධයන්ට ලක් වීමේ ප්‍රවණතාව අඩු කිරීමේ හැකියාවක් මෙම ප්‍රතිඔක්සිකාරකවල පැවතීමයි. එබැවින් ඉහත සඳහන් ප්‍රෙද්ශ වලින් නෙළා ගත් දළු වලින් නිෂ්පාදිත තේ පානය කිරීමෙන් යහපත් නිරෝගී ජීවන රටාවක් පවත්වා ගෙන යාමට මහත් රුකුලක් වනු ඇතැයි එම පරීක්ෂකයන්ගේ නිගමනය යි.

*abeysinghedc@yahoo.com

203/B

ප්‍රතිඔක්සිකාරක සහ ෆීනොලික සංයෝග බහුල පහත රට නිමි තේ

පී.සී.ජේ. පනාගොඩ[1] , එම්.එම්. නිපුනිකා[1] , ආර්.ඒ.ඒ.පී. මාරපන[1] , ඩී.වී.සී. අබේසිංහ[2] සහ ඩී.සී. අබේසිංහ[1*]

[1]කෘෂිකර්ම හා වැවිළි කලමණාකරණ අධ්‍යයනාංශය, කෘෂිකර්ම හා වැවිළි කලමණාකරණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල.
[2]ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

වර්ෂ 1867 දී බ්‍රිතාන්‍ය ජාතික වැවිලි කරුවෙකු වූ ජේම්ස් ටේලර් මහතා විසින් මහනුවර දිස්ත්‍රික්කයේ හේවාහැට ප්‍රදේශයේ ලූල්කඳුර වතුයායේ අක්කර 19 කින් යුත් වාණිජ තේ වගාවක් ආරම්භ කිරීමත් සමඟ අවට ප්‍රදේශවල පැතිර ගිය තේ වගාව අද වන විට උඩරට, මැදරට හා පහත රට යන ප්‍රධාන භූ විෂමතා කලාපවලට අයත් නුවරඑළිය, උඩපුස්සැල්ලාව, දිඹුල, ඌව, නුවර, සබරගමුව හා රුහුණ යන අනු භූ විෂමතා කලාප 7 ක් යටතේ ලංකාව පුරා ව්‍යාප්තව පවතී. මෙම භූ විෂමතා කලාප වල ඇති එකිනෙකට වෙනස් පාංශු සංඝටක හා දේශගුණික තත්වයන් හේතුවෙන් මෙම කලාපවල වැවෙන තේ එයටම ආවේනික රසයකින්, පාටකින් හා සුවඳකින් යුක්ත වන අතර ඒවා වර්ග කර ඇති ශ්‍රේණි (Grades) අනුව එම ලක්ෂණ උච්ඡාවචනය වේ. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවාසි ජනතාව තම තේ පානය සකසා ගැනීම සඳහා විවිධ තේ ශ්‍රේණි යටතේ නිෂ්පාදනය කරන ලද තේ කොළ භාවිතා කරන අතර ඉන් බි.ඕ.පි. (BOP), බි.ඕ.පි.ෆ්. (BOPF), ඩස්ට් (Dust) යන තේ ශ්‍රේණි ප්‍රධාන තැනක් ගනී.

තේ වල මිනිසාගේ ශරීර සෞඛ්‍ය බාධාවකින් තොරව පවත්වාගෙන යාමට හා නොයෙක් රෝග වලින් ආරක්ෂාවීමට බෙහෙවින් උපකාරීවන ප්‍රතිඔක්සිකාරක ගුණය හා ෆීනොලික සහ ප්ලෙවනොයිඩ් ඇතුලු සංඝටක නොවඩුව පවතී. නමුත් තේ පරිභෝජනය කරන ජනතාව සිය තේ කෝප්පයෙහි අඩංගු ඉහත සංඝටක වල ප්‍රමාණාත්මක අගයන් පිළිබඳව නිසි අවබෝධයක් නොමැති අතර ඒ සම්බන්ධයෙන් දැනුවත් වීමට ඇති අවස්ථාද දුරස්ථ මට්ටමක පවතී. එබැවින් මේ සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගැනීම සඳහා ඉහත කලාප 7 හි නිෂ්පාදනය කරන ලද බි.ඕ.පි. (BOP), බි.ඕ.පි.ෆ්. (BOPF), ඩස්ට් (Dust) යන ශ්‍රේණි වලට අයත් තේ කොළ යොදා ගනිමින් එම සංඝටකවල ප්‍රමාණාත්මක තාවයන් පිළිබඳ ඇගයීමක් කරන ලදී.

බී.ඕ.පී (BOP), ශ්‍රේණියට අයත් ෙතේකොළ කැබිලි අෙනකුත් ශ්‍රේණි දෙකට සාපේක්ෂව විශාල වන අතර ඩස්ට් (Dust) ශ්‍රේණියට අයත් තේකොළ කැබලි අනෙකුත් ශ්‍රේණි දෙකට සාපේක්ෂව කුඩාවේ. මෙම ඇගයීමට අනුව කුමන තේ නිෂ්පාදන කලාපයකට අයත් වුවද විශාල කැබලි සහිත තේ කොළ යොදාගෙන සාදා ගන්නා තේ කෝප්පයකට සාපේක්ෂව කුඩා කැබලි සහිත තේ කොළ යොදාගෙන සාදා ගන්නා තේ කෝප්පයක ඉහත සංඝටක අධිකව පවතින බව අනාවරණය විය. එසේම කලාපයන් වෙන් වෙන් වශයෙන් සැලකීමේදී පහත රට තේ නිෂ්පාදන කලාප වන සබරගමුව හා රුහුණ යන කලාපවල නිෂ්පාදනය වන තේ වල ඉහත සංඝටක බහුලව අඩංගු වන බව අනාවරණය විය .එබැවින් මෙම කලාප දෙකෙහි නිෂ්පාදනය කරණු ලබන ඩස්ට් (Dust) යන ශ්‍රේණියට අයත් (කුඩා කැබලි සහිත) තේ පරිභෝජනය සෞඛ්‍යමය වශයෙන් වැඩි ප්‍රතිලාභ ලැබීමට හේතුවන බව දැක්විය හැකිය.

*abeysinghedc@yahoo.com

204/B

“කුළුබඩු ලොව රැජින” කහ කුඩු නිශ්පාදන ක්‍රමවල රසායනික ගුණාත්මයේ වෙනස

එම්.එස්.සී.ජේ. ද සිල්වා[1], ඩී.සී. අබේසිංහ[1*] සහ ආර්.ජේ.එම්. ධර්මදාස[2]

[1]කෘෂිකර්ම හා වැවිලි කලමණාකරණ අධ්‍යයනාංශය, කෘෂිකර්ම හා වැවිලි කලමණාකරණ පීඨය,
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල.
[2]කාර්මික තාක්ෂණ ආයතනය, කොළඹ 07.

කහ යනු මුළුතැන්ගෙයක ආහාර සකස් කිරීමේදී අත්‍යාවශයම කුළුබඩුවකි. කහ කුළුබඩුවක් ලෙස භාවිතා කිරීම මඟින් කහ අලවල අඩංගු ප්‍රතිඔක්සිකාරක ගුණය හා එහි අඩංගු රසායනික සංයෝග මඟින් හෘද සෞඛ්‍ය වැඩි දියුණු කිරීම, පිළිකා සෛලවලට එරෙහිව ක්‍රියාකිරීම, මානසික අවපීඩනය අවම කිරීම වැනි බොහොමයක් සෞඛ්‍යමය ප්‍රතිලාභ ලැබේ.

මෑතකදී රජය විසින් කහ ආනයනය සම්පූර්ණයෙන් වැලැක්වීමෙන් පසුව ජනතාව අතර කහ පිළිබඳව වැඩි කතාබහක් ඇතිවිය. ජනතාව විවිධ ක්‍රම භාවිතා කරමින් කහ කුඩු නිෂ්පාදනය තම නිවෙස්වලදීම සිදු කරන ලදී. නමුත් විද්‍යාත්මකව මෙම ක්‍රම අතර ප්‍රතිඔක්සිකාරක ගුණය හා එහි අඩංගු රසායනික සංයෝග ප්‍රමාණය පරීක්ෂාකර නොමැත.

එමෙන්ම කහ අල, මව් අල හා ඇඟිලි අල ලෙස කාණ්ඩ කල හැක. පැරැන්නන් අතර මව් අල හා ඇඟිලි අල අතර කහ කුඩු නිපදවීමේදී වෙනසක් ඇති බවට මතයක් පැවතුණි. එවන් වකවානුවක පරීක්ෂකයන් කණ්ඩායමක් විසින් සිදුකරන ලද මෙම පර්යේෂණයේ අරමුණ වූයේ විවිධ ක්‍රම මඟින් නිශ්පාදිත කහ කුඩුවල ප්‍රතිඔක්සිකාරක ගුණය හා අඩංගු රසායනික සංයෝග ප්‍රමාණය අධ්‍යනය කිරීමයි. පරීක්ෂණය සඳහා කහ අල ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි පාරසරික ප්‍රදේශ වලින් ලබා ගන්නා ලදී (ගාල්ල, මහනුවර, දිවුලපිටිය හා නිකවැරටිය). මෙම අල මව් හා ඇඟිලි අල වශයෙන් වෙන් කොට ඒවා එකිනෙකට වෙනස්වූ නිෂ්පාදන ක්‍රම තුනක් භාවිතා කර නිශ්පාදනය කරන ලදී. මෙම ක්‍රම වූයේ,

- කහ අල ජලයේ තම්බාගෙන කැබලි වලට කපා අව්වේ වේලාගෙන කුඩුකර ගැනීම.
- කහ අල ජල වාෂ්පයෙන් තම්බාගෙන කැබලිවලට කපා අව්වේ වේලාගෙන කුඩුකර ගැනීම.
- තැම්බීමකින් තොරව කහ අල කැබලි වලට කපා අව්වේ වේලාගෙන කුඩුකර ගැනීම.

පර්යේෂණයේ අවසන් නිගමනය වූයේ ප්‍රතිඔක්සිකාරක ගුණය අතින් හා අඩංගු රසායනික සංඝටක ප්‍රමාණය අතින් ඉහත ක්‍රම තුන අතරත්, මව් අල හා ඇඟිලි අල අතරත් කිසිදු වෙනසක් නොමැති බවයි. එමගින් ගම්‍ය වන්නේ ඉහත ඕනෑම ආකාරයක කහ කුඩු නිෂ්පාදන ක්‍රමයන්ගෙන් ඖෂධීය ගුණයෙන් නොවෙනස් කහ කුඩු නිෂ්පාදන සිදු කළ හැකි බවයි.

*abeysinghedc@yahoo.com

205/B

විවිධ කෘෂි දේශගුණික කලාප වලින්ලබා ගන්නා මීපැණි වල ගුණාත්මකභාවය එකිනෙකට වෙනස් වන බව ඔබ දන්නවාද?

ඒ.එස්.අයි. රාජපක්ෂ[1], ඩී.සී. අබේසිංහ[1*] සහ ආර්.ඒම්. ධර්මදාස[2]

[1]කෘෂිකර්ම හා වැවිලි කලමණාකරණ අධ්‍යයනාංශය, කෘෂිකර්ම හා වැවිලි කලමණාකරණ පීඨය,
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල.
[2]කාර්මික තාක්ෂණ ආයතනය, කොළඹ 07.

මී මැස්සන් යනු ප්‍රධාන වශයෙන් ශාකවල පුෂ්ප වෙතින් තම ආහාර අවශ්‍යතාව සපයාගන්නා ඉතා ප්‍රයෝජනවත් ජීවී කොට්ඨාශයකි. මොවුන් පෝෂණය සඳහා මල් පැණි සහ පරාග ලබා ගනී. මී මැස්සන් බෝග පරාගනය කිරීමට සහ පරිසරයේ සශ්‍රීක බව පවත්වා ගෙනයාමට වැදගත් කාර්යභාරයක් ඉටුකරයි.

“මී පැණි” හෙවත් “මධු” ලෙසින් හැඳින්වෙන්නේ මී මැස්සන් විසින් පැණි නිපදවන ශාක වලින් එකතු කරන ලද පැණි භාවිතා කර සාදන සීනි සහිත ද්‍රව්‍යයකි. ඉතා ඉහළ ඖෂධීය වටිනාකමක් ඇති මී පැණි, අතීතයේ සිට පුරාණ හෙළ වෙදකමේ දී සුව නොවන තුවාල සුව කිරීමට, දියවැඩියාව, උගුරේ ආසාදන, ඇස් ආශ්‍රිත රෝගාබාධ වැනි විවිධ රෝගාබාධ සඳහා ප්‍රතිකාර කිරීමට යොදාගෙන ඇත. කොවිඩ් 19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස මී පැණි එහි ඇති ප්‍රතිශක්තිය ඉහළ නැංවීමේ ගුණාංග හේතුවෙන් මෑතකදී සමාජයේ වඩාත් ආකර්ෂණය දිනාගෙන ඇත.

මී පැණි වල ඇති මෙම ඖෂධීය වටිනාකම පැණි ලබාගන්නා ශාක ප්‍රභවය, පාරිසරික හා දේශගුණික සාධක හා මී මැස්සන් විශේෂය වැනි බොහෝ සාධක මත රඳා පවතී. එනම් විවිධ ප්‍රදේශ වලින් ලබාගන්නා මී පැණි වල ඇති ගුණාත්මකභාවය වෙනස් වන බව මෙයින් තහවුරුවේ. ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප 46 ක් ඇති අතර විවිධ කෘෂි දේශගුණික කලාප වලින් ලබාගන්නා මී පැණි වල ඇති ගුණාත්මකභාවය හා රසායනික ගුණ පිළිබඳව දේශීය වශයෙන් මෙතෙක් සිදුකර ඇති විද්‍යාත්මක පර්යේෂණ අල්පය. එබැවින්, ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වන අම්පාර (පහතරට වියළි කලාපය), බිඳුනුවැව (උඩරට අතර මැදි කලාපය), කොත්මලේ (මැදරට තෙත් කලාපය), දෙනියාය (මැදරට තෙත් කලාපය), වාරියපොල (පහතරට අතරමැදි කලාපය), මාවතගම (පහතරට අතරමැදි කලාපය), මහියංගනය (පහතරට අතරමැදි කලාපය), මාතර (පහතරට තෙත් කලාපය) සහ වෙළෙඳ පොළින් ලබාගත් මී පැණි සාම්පල වල ඖෂධීය ගුණ සහ රසායනික ගුණාංග ඇගයීම සඳහා අධ්‍යනයක් සිදුකරන ලදී.

මෙහිදී අම්පාර ප්‍රදේශයෙන් (පහතරට වියළි කලාපයෙන්) ලබාගත් මී පැණි වල ඉහළ ඖෂධීය ගුණයක් ඇති බව වාර්තාවිය. මෙයට හේතුව එම මී පැණි සාම්පලය ලබාගත් ස්ථානයේ විශාල ශාක විවිධත්වයක් තිබීම වියහැකිය. තවද, වෙළෙඳපොළෙන් ලබාගත් මී පැණි සාපේක්ෂව අඩු ගුණාත්මකභාවයෙන් යුක්ත වන බව වාර්තාවිය. මේ අනුව විශාල ශාක විවිධත්වයක් ඇති ප්‍රදේශවල මී මැසි පාලනය දිරිගැන්වීම මගින් ගුණාත්මකභාවයෙන් ඉහළ මී පැණි නිෂ්පාදනය කළහැකිබව මෙම පරීක්ෂණයෙන් පෙනී යයි.

*abeysinghedc@yahoo.com

206/B

පහත රට කළු තේ වල ජෛව සක්‍රීය සංයෝග මත තේ කොළ පැසවීමේ උෂ්ණත්වයේ සහ කාලයේ බලපෑම

ආර්.ඒ.යූ.ජේ. මාරපන* සහ කේ.වී.කේ.එන්. සේනාධීර

ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.

දුම්රිය හරස් මාර්ග අනතුරුදායකම අනතුරු කලාපයන් වන අතර එහි ආරක්ෂාව පිලිබඳ සලකා බැලීම ප්‍රධාන අත්‍යවශ්‍යම කරුණකි. දුම්රිය-වාහන අනතුරු සඳහා වඩාත් බලපාන සාධක පරීක්ෂා කිරීම සහ දුම්රිය හරස් මාර්ගයේ භෞතික ලක්ෂණ අතර සම්බන්ධතාවක් ගොඩනැගීම මෙම පර්යේෂණයේ අරමුණු විය. කොළඹ කොටුව සිට බදුල්ල දක්වා දුම්රිය මාර්ගය ඔස්සේ දුම්රිය හරස් මාර්ග ලක්ෂණ, මාර්ග භෞතික ලක්ෂණ සහ අනතුරු දත්ත රැස් කරන ලදී. ක්ෂේත්‍ර සමීක්ෂණවලින් සහ දුම්රිය දෙපාර්තමේන්තුව, මරදානේ දුම්රිය මෙහෙයුම් සහ පාලන මධ්‍යස්ථානය වෙත ගොස් දත්ත රැස් කරනු ලැබීය. හදිසි අනතුරු දත්ත සමඟ ස්වාධීන විචල්‍ය (independent variables) කිහිපයක් සම්බන්ධ කිරීමට බහු රේඛීය ප්‍රතිගාමී විශ්ලේෂණය (Multiple Linear regression analysis) භාවිතා කරන ලදී. මෙමගින් ප්‍රධාන දුම්රිය මාර්ගයේ දුම්රිය හරස් මාර්ගවල නිතර සිදුවන අනතුරු හඳුනා ගනු ලැබිණි. දුම්රිය හරස් මාර්ග සම්පූර්ණයෙන් ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වුවද නාගරික දුම්රිය හරස් මාර්ගවල සම්පූර්ණ දිග බූම් බාධක (boom barriers) නොමැතිවීම අනතුරුවලට ප්‍රධාන හේතුවක් විය. 95% ක විශ්වාසනීය මට්ටමක් සඳහා සංඛ්‍යානමය වශයෙන් වැදගත් (statistically significant) වන සාධක කිහිපයක් ආදර්ශ ප්‍රතිදානය (Model output) ඔප්පු කළේය. 0.05 (5%) ට වඩා අඩු අගයන් ලබා ගැනීමෙන්, වම් පසින් ඇති බාධාව 'ඉහළ' (Obstruction from the left side ‘High’), දකුණු පස සිට පෙනීමේ දුර (Sight distance from the right side) සහ දුම්රිය වේගය (Train speed) සැලකිය යුතු භෞතික ලක්ෂණ ලෙස සොයා ගන්නා ලදී. ක්ෂේත්‍ර අධ්‍යයනයේදී හඳුනාගත් දුම්රිය හරස් මාර්ග අනතුරු සඳහා තීරණාත්මක සාධකයක් (Critical factor) ලෙස පෙනීමේ දුර (Sight distance) ද සොයා ගත් අතර එය ආදර්ශ ප්‍රතිදානයෙන් (Model output) තහවුරු විය. දුම්රිය හරස් මාර්ග ආශ්‍රිතව ඇති අධික වෘක්ෂලතාදිය (vegetation) සහ අනවසර ගොඩනැඟිලි මාර්ග භාවිත කරන්නන්ට පෙනීමට බාධා එල්ල කිරීම (obstructing the sight distance) ප්‍රධාන හේතුවක් වූ බැවින් දුම්රිය හරස් මාර්ගවල ඇති අනවශ්‍ය ගස් හා අනවසර ගොඩනැඟිලි ඉවත් කිරීමට රජයේ ආධාර මත ව්‍යාපාර (campaigns) කිරීම නිර්දේශ කරන ලදී. බූම් ගේට්ටුව (boom barrier) වසා දැමීමෙන් පසුවද දුම්රිය හරස් මාර්ගය හරහා අනවසරයෙන් ගමන් කරන අය සඳහා වන වත්මන් දඩය වැඩි කිරීමට යෝජනා කර ඇති අතර ගේට්ටු ක්‍රියාකරුවෙකුගේ වැටුප ඔවුන්ගේ රැකියාව ගැන උනන්දු වන මට්ටමට වැඩි කිරීමට නිර්දේශ කෙරේ.

*piyumikaabeyrathne1995@eng.pdn.ac.lk

311/C

වෙරළ තීරයේ භෞතික ගුණාංග (අවසාදිත ප්‍රමාණය) ඉක්මනින් හඳුනා ගැනීම

ඊ.එම්.එම්.ඩබ්ලිව්.සි.යූ.රත්නායක*, R.S.M. සමරසේකර

සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තු, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ, ශ්‍රී ලංකාව

වෙරළක් යනු උස් සහ පහත් ජල සලකුණු අතර ගල් කැට හෝ වැලි සහිත වෙරළකින් සමන්විත ගතික පරිසරයකි. වෙරළබඩ යටිතල පහසුකම් සැලසුම් කිරීම සඳහා අංශු ප්‍රමාණය ව්‍යාප්තිය, ඝනත්වය සහ පාංශු වර්ගය වැනි භෞතික ගුණාංග අත්‍යවශ්‍ය වේ. ආරක්ෂාව සහ පහසුව වැඩි දියුණු කිරීම සඳහා සාම්ප්‍රදායික ක්‍රම භාවිතා කිරීම වෙනුවට ගුවන් රූප වලින් වෙරළේ අංශු ප්‍රමාණ ව්‍යාප්තිය හඳුනා ගැනීමට මෙම පර්යේෂණය අවධානය යොමු කරයි. වෙරළ තීරයක වැලි කැට වල ප්‍රමාණ ව්‍යාප්තිය මගින් නිශ්චිත කලාපයක වෙරළ තීරය හැඩගස්වා ඇති සාගර ක්‍රියාවලීන් පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය. වැලි කැටවල විශාලත්වය වෙරළ තීරයේ බෑවුමට සම්බන්ධ වේ. එසේම, ඛාදනය වන වෙරළ තීරයේ වැලි නැවත පිරවීම සඳහා හොඳම ආකාරය දැන ගැනීමට ප්‍රධාන ක්‍රමවේදය ලෙස රූප සැකසීම සමඟ පරිගනක ක්ෂ්ත්‍රයේ පවතින ගැඹුරු ඉගෙනුම් ආකෘති භාවිතා වේ. Convolutional Neural Network (CNN) සංකල්පය භාවිතා කිරීමෙන් යෝජිත රූප සැකසීමේ සහ විශ්ලේෂණයේ ඒකාබද්ධ පරිගණක ඇල්ගොරිතම භාවිතයෙන් බොරළු සහ වැලි අංශු ප්‍රමාණ ව්‍යාප්තිය ඇගයීමට ලක් කෙරේ. මෙහිදී වර්ගීකරණ නිමැවුම් පන්තිවලට වැලි, බොරළු (හෝ ගල් කැට) වැනි වෙරළ සංයුතින් ඇතුළත් විය. මාරවිල වෙරළ ප්‍රදේශයේ වැලි නියැදිය එක්රැස් කර සත්‍යාපනය සිදු කළ අතර අංශු ප්‍රමාණය ව්‍යාප්තිය පිළිබඳ පෙරන කිහිපයක් භාවිතයෙන් විශ්ලේෂණයක් සිදු කරන ලදී. රූප සැකසුම් තාක්ෂණය සහ CNN පරිගනක කේත නිර්මාණය කිරීම සඳහා පරිගණක දෘෂ්ඨී ඇල්ගොරිතමයක් නිර්මාණය කරන ලදී. නිවැරදි මූලික අගයන් සහ පරිගනක කේත මගින් ලැබෙන අගයන් සංසන්දනය කිරීමට මෙම ක්‍රම දෙක භාවිතා කරන ලදී. CNN නිර්මාණ ශිල්පයේ ප්‍රතිඵල සලකා බැලීමේදී, අනාවැකි අගය පරාසය 88%-99% අතර විය. මූලික අංශු ප්‍රමාණයේ ව්‍යාප්ති අගය සහ ආදර්ශ අංශු බෙදා හැරීමේ අගය සංසන්දනය කිරීමේදී බොරළු ව්‍යාප්තියේ අගයන් 40.98% - 51.98% පරාසයේ වෙනසක් ඇති අතර වැලි ව්‍යාප්තියේ අගයන් 48% කින් වෙනස් වේ. අවසාන වශයෙන්, ගුවන් ඡායා රූප සහ CNN නිර්මාණ ශිල්පය භාවිතයෙන් බොරළු සහ වැලි අංශු 88%-99% සහ බොරළු අංශු 98% ක ප්‍රමාණයේ ව්‍යාප්තිය පිළිබඳ පුරෝකථනය කළ හැකිය. වැඩි ගුවන් ඡායා රූප ප්‍රමාණයක් භාවිතා කිරීම සහ පින්තූර පරීක්ෂා කිරීම මගින් වඩාත් නිවැරදි අනාවැකි අගයක් පෙන්වයි. එබැවින්, ඉහත අගයන්ට වඩා හොඳ ප්‍රතිශතයක් සමඟ හඳුනා ගැනීමට වැලි සහ බොරළු ගුවන් ඡායා රූප වැඩි ප්‍රමාණයක් අවශ්‍ය වේ. එසේම, CNN භාවිතා කරමින් මැටි සහ ගල් කැට වැනි තවත් අංශු හඳුනා ගැනීමට මෙම අධ්‍යයනය දීර්ඝ කළ හැක. මේවා වඩාත් නිවැරදි අංශු ව්‍යාප්ති අගයන් ලබාගැනීමට උපකාරී වේ.

*curathnayake@gmail.com

312/C

ප්ලාස්ටික් විජ්ස් සහ සිමෙන්ති සමඟ මිශ්‍ර කිරීමෙන් මෘදු පසෙහි ශක්තිය වැඩි දියුණු කිරීම

ඊ.එම්.කේ.ජී.ඒ.ඩී.බී. ඒකනායක[1] , ඩබ්ලිව්.එම්.එන්.ආර්. වීරකෝන්*

සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, ඉංජිනේරු පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ, ශ්‍රී ලංකාව

ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ පසෙහි භෞතික ගුණාංග වැඩි දියුණු කිරීම සඳහා මෘදු පාංශු ස්ථායීකරණය සාමාන්‍යයෙන් භාවිතා වේ . ඒ සඳහා සඳහා සිමෙන්ති සහ හුණු ගල් භාවිතා කිරීම සාමාන්‍ය පිළිවෙතයි. නමුත් සිමෙන්ති නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ක්ෂය වීමත් සමඟ පාංශු ස්ථායීකරණය සඳහා විකල්ප ක්‍රම පිළිබඳව අදහස් මතුව ඇත. ඊට අමතරව මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ඉදිකිරීම් භූමියේ පාංශු තත්ත්වය කාලයත් සමඟ නරක අතට හැරෙමින් පවතී. එවැනි විකල්ප ක්‍රමයක් සොයා ගැනීමට කරන ලද අධ්‍යයනයේදී ශක්ති ලක්ෂණ වැඩි දියුණු කිරීම සඳහා බෙල්ලන්විල වගුරු බිම්වලින් ලබාගත් මෘදු පස් සාම්පලවලට පොලිඑතිලීන් ටෙරෙෆ්තලේට් (PET) කැබලි සහ සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති (OPC) මිශ්‍ර කර ඇත. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ සාක්ෂාත් කරගනු ලැබුවේ සීමා නොකළ සම්පීඩක ශක්තිය (Unconfined Compressive Strength, UCS) පරීක්ෂණය සහ සෘජු කැපුම් පරීක්ෂණය(Direct Shear Test, DST) පැවැත්වීමෙනි. පරීක්ෂණ ප්‍රතිඵලවලට අනුව, ප්‍රතිකාර කරන ලද පස් සාම්පල, මුල් පස හා සසඳන විට කැපී පෙනෙන ශක්ති වර්ධනයක් පෙන්නුම් කර ඇත. ඉහත පරීක්ෂණ සඳහා 5 mm සහ 10 mm වැනි විවිධ PET කැබලි ප්‍රමාණ 2ක් සඳහා, 3% සහ 6% OPC ප්‍රතිශතයන් සමඟ 5%, 10% සහ 15% PET ප්‍රතිශතයන් මිශ්‍ර කිරීමෙන් පරිමාව මත පදනම් වූ අනුපාතයට අනුව මිශ්‍රණ අනුපාතයන් 12 සකස් කරගන්නා ලදී. UCS සඳහා නිදර්ශක 36 ක් සහ DST සඳහා නිදර්ශක 12 ක් දින 3, 7, 14 සහ 28 ලෙස කාල පරිච්ඡේද 4 ක් සඳහා පරීක්ෂා කරන ලදී. සියලුම කාල සීමාවන් සඳහා OPC සහ PET අන්තර්ගතය එකතු කිරීමත් සමඟ UCS සහ කැපුම් ශක්තිය වැඩි විය. PET විජ්ස් වල ප්‍රමාණය UCS සහ shear strength අගයන් දෙකෙහිම වැඩිවීමට බලපා ඇත. පාංශු ස්ථායීකරණයෙන් පසු, වැඩිම සිමෙන්ති ප්‍රතිශතය (6%) සහ විශාලතම ප්ලාස්ටික් කැබලි(මි.මී. 6 ප්‍රමාණයේ ප්ලාස්ටික් විජ්වලින් 15%) සහිත නියැදිය දින 28 න් පසු 18.15 kPa ක සම්පීඩක ශක්තියක් සහ 40.98 kPa ක කැපුම් ශක්තියක් ලබා ගැනීමෙන් ප්‍රශස්ත ප්‍රතිඵල පෙන්නුම් කර ඇත. අමිශ්‍ර මෘදු පසෙහි ගුණාංග හඳුනාගැනීම සඳහා ඇට(ර්)බ(ර්)ග් සීමා පරීක්ෂණ, අංශු ප්‍රමාණය ව්‍යාප්තිය සහ සම්මත ප්‍රොක්ටර් සංයුක්ත පරීක්ෂණ සිදු කරන ලද අතර දියර සීමාව (Liquid limit) සහ ප්ලාස්ටික් සීමාව (Plastic limit) පිළිවෙලින් 46% සහ 23.34% ලෙස ලබා ගන්නා ලදී. ප්‍රශස්ත තෙතමනය 35.2% වන අතර උපරිම වියළි ඝණත්වය 882 kgm^{-3} වේ.

*weerakoon@sjp.ac.lk

306/C

DRASTIC-LU மூலம் இலங்கையின் கலா ஓயா படுகையின் நிலத்தடி நீர் பாதிப்பை மதிப்பீடு செய்தல்

எஸ். ஹிமானுஜான்[1], டி.ஏ.என்.என். சேனாதீர[1], ஈ.ஏ.என்.வி. எதிரிசிங்க[2], எம். விதானகே[3] மற்றும் பி.சி.எல். அத்தபத்து[1*]

[1]கட்டடப் பொறியியல் துறை, பொறியியல் தொழில்நுட்ப பீடம், இலங்கை திறந்த பல்கலைக்கழகம், நாவல, நுகேகொட. [2]ஐசோடோப்பு ஹைட்ராலஜி பிரிவு, அணு ஆற்றல் ஆணையம். [3]பிரயோக விஞ்ஞான பீடம், ஜயவர்தனபுர பல்கலைக்கழகம், கங்கோடவில, நுகேகொட

வடமத்திய மற்றும் வடமேற்கு மாகாணங்களில் சுமார் 2870 சதுர கிலோமீற்றர் வரை பரவியுள்ள கலா ஓயா ஆற்றுப் படுகையே ஆய்வுப் பிரதேசமாகும். முதன்மை நீர்நிலையானது சிறிய தொட்டி அடுக்குகளைக் கொண்ட உருமாற்றப் பாறையின் ரெகோலித் நீர்நிலை ஆகும். இங்கு நீர் மட்டம் தரை மட்டத்திலிருந்து 2 மீற்றர் முதல் 10 மீற்றர் வரை இருக்கும். நிலத்தடி நீர் பொதுவாக தென்கிழக்கிலிருந்து வடமேற்கு நோக்கி பாய்கிறது. உள்நாட்டு, தொழில்துறை மற்றும் விவசாய பயன்பாட்டிற்கான முதன்மையான நீராதாரம் நிலத்தடி நீர் ஆகும். இப்பிராந்தியத்தின் சில பகுதிகளில் நில பயன்பாட்டைப் பொறுத்து, அதிகப்படியான நிலத்தடி நீர் பயன்பாடு, தண்ணீர் பற்றாக்குறை மற்றும் நீரின் தரம் குறைவதற்கு வழிவகுக்கின்றது. இது நிலத்தடி நீர் மாசுப்படுதலின் பாதிப்பு தொடர்பான வரைபடத்தை உருவாக்குவதற்கான அடித்தளமாக செயல்பட்டது. நிலப் பயன்பாட்டினால் நிலத்தடி நீரிற்கு ஏற்பட்டுள்ள பாதிப்பினை இனங்காண்பதே இந்த ஆய்வின் நோக்கமாகும். இங்கு மாற்றியமைக்கப்பட்ட DRASTIC-LU மாதிரியின் மூலம் நிலத்தடி நீர் பாதிப்பு மதிப்பிடப்பட்டுள்ளது. ஒவ்வொரு உள்ளீடுகளுக்கும் கொடுக்கப்பட்ட எடைகள் மற்றும் மதிப்பீடுகள் சுட்டெண்ணை உருவாக்க சேர்க்கப்பட்டுள்ளன. மேலும் இச்சுட்டெண்ணானது, ஆய்வுப் பிரதேசத்தில் 7% குறைந்த பாதிப்பு மண்டலம் எனவும், 40% மிதமான பாதிப்பு மண்டலம் எனவும், 29% அதிக பாதிப்பு மண்டலம் எனவும், 24% அதி உயர் பாதிப்பு மண்டலம் எனவும் காட்டுகின்றது. மாதிரியிலுள்ள நீரியல் அளவுருக்களின் ஒழுங்குபடுத்தலின் காரணமாகவே இந்த மாறுபாடுகள் ஏற்பட்டுள்ளன. மிகவும் பாதிக்கப்பட்ட மண்டலங்கள் மத்திய மற்றும் கிழக்கு பகுதிகளில் உள்ளன. அசுத்தங்களை மேற்பரப்பில் இருந்து ஆழமான நீர்நிலை மண்டலங்களுக்கு ஊடுருவல் மூலம் கொண்டு செல்லும் அதிக நிகர நீர் நிரம்பலானது இதற்கான சாத்தியமான காரணமாக அமையலாம். மண்ணின் மணல் களிமண் அமைப்பு விரைவான ஊடுருவலுக்கு மேலும் உதவக்கூடும் என்பதும் கவனிக்கப்படுகிறது. சிறிய சாய்வு நிலையானது மாசு ஊடுருவிச் செல்வதற்கு கணிசமான நேரத்தை வழங்குவதன் மூலம் மாசுபடுத்தும் செயல்முறையை துரிதப்படுத்துகிறது. மிதமான பாதிப்புக்குள்ளாகும் மண்டலம் பெரும்பாலும் உழவு நில பயன்பாட்டு முறையுடன் பொருந்துகிறது. இந்த பகுதியில் உள்ள மானுடவியல் செயல்பாடு விவசாய நடைமுறைகளால் நிலத்தடி நீரின் பாதிப்பிற்கு பங்களிக்கிறது. DRASTIC கணக்கீட்டில் இருந்து விலக்கப்பட்ட அடுக்குகளின் எண்ணிக்கை அதிகரித்ததால் மாறுபாடு குறியீடு அதிகரித்தது. சில அடுக்குகளை அகற்றுவது (A, T மற்றும் R) பாதிப்பு மதிப்பீட்டைப் பாதிக்கிறது. மேலும் இது அனைத்து உணர்திறன் சோதனைகளாலும் நிரூபிக்கப்படுகிறது. இருப்பினும், சில சராசரி மாறுபாடு சுட்டெண்களின் பொருள் விளக்கத்திற்கு மேலும் ஆய்வுகள் அவசியம். திட்டமிடல், கொள்கை மற்றும் செயல்பாட்டு நிலைகளில், நிலத்தடி நீர் முகாமைத்துவம் மற்றும் பாதுகாப்பிற்கான தீர்மானம் எடுக்கும் செயல்பாட்டில், நிலத்தடி நீர் பாதிப்பு வரைபடம் பயனுள்ள முதல் படியாக அமையும்.

*bcliy@ou.ac.lk

304/C

මළ ගංගා (කාලීනව සිඳීයන) සහ බහු වාර්ශික ගංගා (ස්ථිර ජල ප්‍රවාහ) වල ජල අවශෝෂණය සහ ගලා යෑමේ හැකියාවන් නිරීක්ෂණය

ටී. එම්. සී. අයි. මධුශානි*, පී. අයි. ඒ. ගෝමස්

සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය, නව නුවර පාර, මාලබේ

බහු වාර්ශික ගංගා (ස්ථිර ජල ප්‍රවාහ) මෙන් නොව මළ ගංගා (කාලීනව සිඳීයන) අධික වර්ෂාපතනයකින් පසුව, වසරේ ඇතැම් කාලවලදී පමණක් ගලා යයි. ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශවල සහ වියළි දේශගුණික කලාපවල මළ ගංගා බහුලව දක්නට ලැබෙනමුත් මෙම ගංගා පිළිබඳ අපගේ දැනුම තරමක් සීමිතය. මෙම අධ්‍යයනය සිදු කරනු ලැබුවේ පොළවේ මතුපිට පවතින ජලය, භූගත ජල ස්ථර දෙසට ගමන් ගන්නා ආකාරය සහ මළ ගංගාවන්ට ආසන්න ප්‍රදේශවල ජලය අවශෝෂණය කිරීමේ හැකියාව විමර්ශනය කිරීමට සහ අනෙකුත් බහු වාර්ශික ගංගා සමඟ සන්සන්දනය කිරීම සඳහාය. අතරමැදි දේශගුණික කලාපයේ පිහිටි ලොග්ගල් ඔයට ගලා බසින ඇළක් ආශ්‍රිතව මෙම පරීක්ෂණ සිදු කර ඇත. බහු වාර්ශික ගංගා වලට සාපේක්ෂව මළ ගංගාවන්හි ජල අවශෝෂණ ධාරිතාවය දෙගුණයකින් පමණ වැඩි විය. එමෙන්ම මළ ගංගා ආශ්‍රිතව ජලය භූගත ජල සංචිත දක්වා ගලායෑමේ වේගයද බහු වාර්ශික ගංගා වලට වඩා සාපේක්ෂව වැඩිය. අවසාන වශයෙන්, මළ ගංගා යනු ජලය අවශෝෂණය කිරීමේ සහ මතුපිට ජලය භූගත ජල සංචිත දක්වා ගෙන යාමේදී ඉතාමත් වැදගත් වන ප්‍රවාහයකි. මන්දයත්, මෙමගින් භූගත ජල ප්‍රමාණය ඉහළ නැංවීමට මෙන්ම ඒ ආශ්‍රිත ප්‍රදේශයන්හි ගංවතුර අවධානම පාලනය කිරීමට ද ඉවහල් වන බැවිනි.

*charuni.ma@sliit.lk

307/C

බහුලව භාවිතා වන ජල මෘදුකාංගයක් භාවිතා කරමින් තාවකාලික කුඩා ගංගා ප්‍රවාහය අධ්‍යයනය කිරීම

එම්. ඩී. ඩී. පෙරේරා*, පී. අයි. ඒ. ගෝමස්

සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය, නව නුවර පාර, මාලබේ,
ශ්‍රී ලංකාව

තාවකාලික කුඩා ගංගා වල තෙත් සහ වියලි අවධීන් ඇති අතර, වර්ෂා කාලවලදී පමණක් එවා ගලා බසින නිසා මළ ගංගා ලෙසද හැඳින්වේ. ඒවා මිරිදිය ජල මූලාශ්‍ර ලෙස අඩු තක්සෙරුවක් දී ඇතත්, ලෝකයේ මුලු ගංගා දිගෙන් අඩකටත් වඩා සමන්විත වන්නෙ මළ ගංගා වලිනි. තාවකාලික ගංගා ගලන ආකාරය මෘදුකාංග භාවිතා කරමින් ජල ප්‍රවාහන අධ්‍යයන ගංගා වලට අලුත් දෙයක් නොවුවද, මළ ගංගා වලට එසෙ නොවේ. එමනිසා මෙම ගංගා පිළිබඳව අප සතුව ඇති දැනුමේ හිඩැසක් ඇත. තාවකාලික ගංගා ප්‍රවාහ රටාව මූලිකවම එම ස්ථානයේ වර්ෂාපතනය මත රඳා පවති. තවද, එය ගංගා පතුලෙ සිට පස හරහා පහළට ජලය ගලා බසින වෙගය මත රන්දා පවතී. අප කල ක්ෂේත්‍ර පර්යෙෂණ අනුව එය ජල පොෂක ප්‍රදෙශ වල සාමාන්‍ය අගයන්ට වඩා දස ගුනයකින් පමන අගයන් ගනි. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ තාවකාලික ගංගා ගලායාම සමාකරනය කිරීම සඳහා නොමිලේ සහ බහුලව භාවිතා වන පරිගණක මෘදුකාංගයක් වන HEC-HMS මෙම පර්යෙෂණයේ භාවිතා කරන ලදී. අධ්‍යයන ප්‍රදේශයෙන් ලබාගත් දත්ත ගංගාව සමාකරනය කිරීමට භාවිතා කරන ලද අතර, සෘජු ප්‍රවාහය (වර්ෂාපතනය හේතුවෙන්) ජනනය කරන ලදී. මෙය සිදු කරනු ලැබුවේ ප්රවාහය සමග වර්ෂාපතනය සහ ඉහළම ප්රවාහ පරිමාව සමග ප්රවාහයට ජලය එකතු වන ප්රදේශය අතර සම්බන්ධතා විමර්ශනය කිරීම සඳහා ය. 2020 වසරේ වියළි සහ වැසි සහිත කාලවලදී මෘදුකාංගය මගින් ජනනය වූ ප්‍රවාහය, අධ්‍යයන ප්රදේශයෙ නිරීක්ෂණය කල ප්‍රවාහයට බොහො සෙ සමාන විය. තවද ප්‍රවාහය සහ වර්ෂාපතනය මෙන්ම ඉහළම ප්‍රවාහය සහ දායක ප්‍රදේශය අතර ශක්තිමත් ධනාත්මක සබඳතා පෙන්නුම් කරන ලදී. මෙම අධ්‍යයනය මගින් තාවකාලික ගංගා ප්‍රවාහය සමීපව සමාකරණය කිරීම සඳහා පොදු මෘදුකාංග සාර්ථකව භාවිතා කිරීමේ යම් හැකියාව නිරීක්ශණය කරන ලදි. අප මෙය ගැන වැඩි දුර අධ්‍යයනයන් නිර්දෙශ කරනු ලබන අතර එවායේ ප්‍රතිපල මළ ගංගා සංරක්ෂණයට කිරීම සන්දහා දායක වනු ඇතයි විශ්වාස කරමු.

*devki.d.perera@gmail.com

302/C

නව ඇල්ජිනේට් නැනෝ තන්තු සහිත ප්‍රතිබැක්ටීරීය සැරහුමක ශක්‍යතාව අධ්‍යයනය කිරීම

එන්.එස්.එල්. දිසානායක[1]

[1]පේශකර්ම දෙපාර්තමේන්තුව, ඉංජිනේරු පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද, ශ්‍රී ලංකාව.

තුවාලයක් ආවරණය කිරීම සම්මත තුවාල සත්කාරයේ අත්‍යවශ්‍ය අංගයකි. තුවාලයකට ප්‍රතිකාර කරන අතරතුර, තුවාලය ආරක්ෂා කිරීමට සහ සුව කිරීමේ පරිසරයක් සැපයීමට ආවරණයක් ක්‍රියා කරයි. කෙසේවෙතත්, සාම්ප්‍රදායික තුවාල ආවරණ වල අවාසි ලෙස දුර්වල බාධක ගුණ, දුර්වල රක්ත ස්ථිතකය සහ තුවාල වලට පහසුවෙන් ඇලීම ඇත. එබැවින්, සාම්ප්‍රදායික තුවාල ආවරණවල අවාසි සලකා බැලීමේදී, සමට ඇලී සිටීමෙන් අමතර හානි වළක්වන, ඉහළ ප්‍රතිබැක්ටීරීය ක්‍රියාකාරිත්වයක් ඇති සහ හොඳ වාතාශ්‍රයක් ලබා දීමේ හැකියාව සහ ජලයට ඔරොත්තු දෙන ගුණයෙන් යුත් තුවාල සුව කිරීමට හැකියාව සහිත නව තුවාල ආවරණයක් නිර්මාණය කිරීම ඉතා වැදගත් වේ. තුවාලයක් ආවරණය කිරීමේදී හොඳ වාතාශ්‍රයක් ලබා දීමේ හැකියාව අනිවාර්ය ගුණාංගයක් වන අතර තුවාලයට තෙතමනය හුවමාරු කිරීම සහ තුවාල වල ලේ කැටගැසීම සහ එපිටිලියල්කරණයට පහසුකම් සපයයි. ජල ආරක්ෂණය යනු තුවාලයට ජලය ඇතුලුවීම වළක්වන තවත් වැදගත් ගුණාංගයක් වන අතර එමඟින් තුවාලය සුව කිරීමේ වේගය වැඩි කරයි. මෙමගින් ජල බිඳිති සමඟ ක්ෂුද්‍ර ජීවීන් ද තුවාලයතුලට යාම වළක්වයි. ප්‍රති-ක්ෂුද්‍ර ජීවී ගුණය තුවාලයක් සඳහා අත්‍යවශ්‍ය වේ, මන්ද එය ක්ෂුද්‍ර ජීවීන් විනාශ කර තුවාලයේ ඉදිමුම වලක්වයි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ජල ආරක්ෂිත, වාතාශ්‍රයක් ලබා දීමේ හැකියාව සහිත සහ ප්‍රති-ක්ෂුද්‍ර ජීවී ගුණ සහිත නව තුවාල ආවරණයක් නිර්මාණය කිරීමයි. සැරහුම ස්ථර දෙකකින් සමන්විත වන අතර, ඇතුළත ස්ථරය රිදී නැනෝ අංශු සහිත ඇල්ජිනේට් නොවියන රෙදි කඩක් වන අතර එය තුවාලවල දියර අවශෝෂණය කර ප්‍රති-ක්ෂුද්‍ර ජීවී ගුණය සපයයි, සහ පිටත ස්ථරය වාතාශ්‍රය සැපයීම සහ ජල ආරක්ෂිත හැසිරීම් යන දෙකම ඇති ජල විකර්ෂක පොලියුරෙතේන් සහ සිලිකා ජෙල් අඩංගු ස්ථරයකි. රිදී නයිට්රේට් රිදී නැනෝ අංශු දක්වා අඩු කිරීම සඳහා අඩු කිරීමේ කාරකයක් සහ ස්ථායීකාරකයක් ලෙස සෝඩියම් ඇල්ජිනේට් භාවිතා කරන ලදී. ප්‍රතිබැක්ටීරීය තුවාල සැරහුමේ ගුණාංග තක්සේරු කරන ලද අතර, ප්‍රතිඵල වලින් පෙන්නුම් කළේ එහි කැපී පෙනෙන ජල අවශෝෂණය සහ රඳවා ගැනීමේ හැකියාව ඇති අතරම තුවාලයෙන් පිටකරන දියර සැලකිය යුතු පරිමාවක් අවශෝෂණය කර ගැනීමට හැකියාව ඇත. මෙම සැරහුම ඉහළ යාන්ත්‍රික ගුණ සහ ජෛව ගැළපුමක් පෙන්නුම් කරයි. අවසාන වශයෙන්, *Pseudomonas aeruginosa* සහ *Staphylococcus aureus* වලට එරෙහිව අභ්‍යන්තර ස්ථරයේ ප්‍රතිබැක්ටීරීය ක්‍රියාකාරීත්වය සැලකිය යුතු තරම් ඉහල විය.

*nethmidissanayake26@gmail.com

Section D

401/D

Exploring the diagnostic potential of extracellular vesicles for tuberculosis

W.R.U.A. Bandara[1], D. Madegedara[2], W.A.I.P. Karunaratne[3] and D.N. Magana-Arachchi[1*]

[1]Molecular Microbiology & Human Diseases project, National Institute of Fundamental Studies, Hantana Road, Kandy, Sri Lanka, [2]Respiratory Disease Treatment Unit, General Teaching Hospital, Kandy, Sri Lanka, [3]Department of Zoology, Faculty of Science, University of Peradeniya, Peradeniya, Sri Lanka

Tuberculosis (TB) is an infectious disease caused by *Mycobacterium tuberculosis*. Each year more than 10 million people become sick with TB, and TB kills more than 1.5 million. TB diagnostics are constantly evolving to end TB soon. Recent studies found that cells are constantly shedding small membrane-bound sac-like vesicles. These tiny sacs carry biologically essential molecules such as DNA, RNA, proteins, lipids, and nucleic acids and aid cell-to-cell communication. These vesicles are diverse in size and shape and are shed by healthy and diseased cells. Also, the outer cell wall composition can change depending on the diseased status. Based on these, scientists have found that studying these small vesicles could give valuable information for clinical applications. According to our knowledge, this is the first study conducted utilizing dynamic light scattering (DLS) technique in the context of TB using these small vesicles in Sri Lanka and globally. In this study, a low-cost polymer called polyethylene glycol and a filter are used to isolate these small vesicles from the serum of TB patients and healthy individuals. The isolated small particles were characterized based on the mean particle size and the spread of the particles, called the polydispersity index (PDI). According to the results, it is evident that particle size is an excellent parameter to differentiate TB patients from healthy individuals. However, the vesicle isolation and storage conditions should be carefully handled to avoid misinterpretation of the results. Despite a few drawbacks, this is a less harmful, easy, and rapid method to identify TB patients. Especially TB being a poor man's disease, this method could be a potential element in TB diagnosis in lower-middle income countries. However, analysis of more samples is needed for validation.

***dhammika.ma@nifs.ac.lk**

403/D

Salinity tolerance of *Aedes sp* Mosquitoes and its impact on Dengue cases in Batticaloa district

W.A.D.Shashikala Keshani* and M.Vinobaba

Department of Zoology, Eastern University, Sri Lanka

Mosquitoes are the disease vectors that cause deadly diseases especially in tropical region of the world. Batticaloa district is one of the highest dengue cases reported district among the ten highest dengue cases (12.47%) reported districts in Sri Lanka, during past five years. Salinity tolerance ability increases the breeding sites of mosquitoes apart from the standard potential freshwater bodies. Therefore, current study was focused to measure the maximum amount of salinity that mosquitoes can tolerate and then identify potential breeding sites rather than fresh water. A total of 330 water samples from 33 naturally breeding locations in four dengue hotspots (Batticaloa, Eravur, Oddamawadi and Valachchenei) in 14 Medical officers of Health (MOH) areas in the district of Batticaloa were collected from August 2021 – November 2021. A ladle dipper was used to obtain samples of larval mosquitoes. Larval species were identified microscopically using standard taxonomic keys. Physicochemical parameters such as temperature, Dissolved Oxygen (DO), pH and salinity of the natural breeding streams water were measured *in-situ* using digital meters. *Aedes aegypti* and Aedes *albopictus* collected from field study were separated into four colonies according to the hotspot and reared. After emerging of first progeny 1st instar larvae and 3rd instar larvae of both species were exposed to different salinity levels of 0, 2, 4, 6, 8, 10, 12, 14, 16,18, 20, 21 and 22 ppt under the laboratory conditions. Probit analysis was performed to determine salinity tolerate of *Aedes* mosquitoes. Overall, a total of 420 *Ae.aegypti* and 386 *Ae.albopictus* were collected from different breeding habitats including boats. The abundance of *Aedes sp* mosquito larvae showed a significant positive correlation ($p < 0.05$) with physico-chemical parameters in breeding habitats, such as temperature (32 °C), DO (20 mgl^{-1},) and salinity (12 ppm). *Ae. aegypti* larvae reported in boat with having small amount of water in the bottom with 10 ppt (max) salinity level. *Ae. albopictus* larvae were reported from the small water pools in the edge of the Batticaloa lagoon with 7 ppt (max) salinity level. According to the results obtained from the salinity tolerance laboratory study both *Aedes* species showed 18 ppt salinity tolerance. The current study concluded that dengue vector mosquitoes can breed in high salinity water mostly found in the Batticaloa District. This may be the reason for reporting high dengue cases in the district and knowledge generated on the ecology of dengue vector mosquitoes will help to eliminate dengue from the country.

*****shashikalakeshani64@gmail.com

403/D

Aedes sp நுளம்புகளின் உவர்சகிப்புத்தன்மையும் , மட்டக்களப்பு மாவட்டத்தில் டெங்கு நோயாளர்களின் எண்ணிக்கையில் ஏற்படும் தாக்கமும்.

W.A.D.ஷஷிகலா கேஷானி **, M.** வினோபபா

குறிப்பாக நுளம்புகள் உலகின் வெப்பமண்டல பகுதிகளில் கொடிய நோய்களை ஏற்படுத்தும் நோய் பரப்புனர்கள் ஆகும். இலங்கையில் கடந்த ஐந்து வருடங்களில் அதிக டெங்கு நோயாளர்கள் பதிவான பத்து மாவட்டங்களில் மட்டக்களப்பு மாவட்டமும்(12.47%) ஒன்றாகும். தரமான நன்னீர் நிலைகளைத் தவிர, உவர்தன்மையை பொறுத்துக்கொள்ளும் திறன் நுளம்புகளின் இனப்பெருக்கத் தளங்களை அதிகரிக்கிறது. இந்த ஆய்வில் நுளம்புகள் பொறுத்துக்கொள்ளக்கூடிய அதிகபட்ச உவர்தன்மையை அளவிடுவதற்கு கவனம் செலுத்தப்பட்டது. நன்னீரைக் காட்டிலும் நுளம்புகள் இனப்பெருக்கம் செய்யக்கூடிய இடங்களாக அடையாளம் காணப்படும் மட்டக்களப்பு மாவட்டத்தில் உள்ள 14 சுகாதார வைத்திய அதிகாரிகள் (MOH) பிரதேசங்கள் நான்கில் (மட்டக்களப்பு, ஏறாவூர், ஓட்டமாவடி மற்றும் வாழைச்சேனை) இயற்கையாக நுளம்புகள் இனப்பெருக்கம் செய்யும் 33 இடங்களில் இருந்து மொத்தம் 330 நீர் மாதிரிகள் ஆகஸ்ட் 2021 முதல் நவம்பர் 2021 வரை சேகரிக்கப்பட்டன. நுளம்புக்குடம்பிகளின் மாதிரிகளைப் பெற அமிழ்த்தும்வலை (Dip net) பயன்படுத்தப்பட்டது. நுளம்புக்குடம்பி இனங்கள் நுண்ணோக்கி மூலம் அடையாளம் காணப்பட்டன. வெப்பநிலை, கரைந்த நிலை ஒட்சிசன் (DO), pH மற்றும் இயற்கை இனப்பெருக்க நீரின் உவர்தன்மை போன்ற பௌதீக, இரசாயனவியல் அளவீடுகள் இலத்திரனியல் உபகரணங்களை பயன்படுத்தி கள ஆய்விடத்திலேயே அளவிடப்பட்டன. கள ஆய்வில் இருந்து சேகரிக்கப்பட்ட Aedes aegypti மற்றும் Aedes albopictus ஆகியவை சிவப்புவலய (Hotspot) அடிப்படையில் நான்கு காலனிகளாக பிரிக்கப்பட்டு வளர்க்கப்பட்டன. முதல் சந்ததி தோன்றிய பிறகு இரண்டு இனங்களின் முதல் நிலை குடம்பி மற்றும் மூண்றாம் நிலை குடம்பி வெவ்வேறு உவர்சகிப்புத்தன்மை அளவுகளான 0, 2, 4, 6, 8, 10, 12, 14, 16,18, 20, 21 மற்றும் 22 ppt களுக்கு ஆய்வுகூட நிலைமைகளின் கீழ் பரிசோதிக்கப்பட்டன. Aedes நுளம்புகளின் உவர்சகிப்புத்தன்மையை கண்டறிய ப்ரோபிட் பகுப்பாய்வு செய்யப்பட்டது. ஒட்டுமொத்தமாக, படகுகள் உட்பட பல்வேறு இனப்பெருக்க வாழ்விடங்களில் இருந்து மொத்தம் 420 Aedes aegypti மற்றும் 386 Aedes albopictus சேகரிக்கப்பட்டன. அதிகளவான Aedes aegypti நுளம்புக்குடம்பிகள் வெப்பநிலை (32 degree Celsius), DO (20mgl-1,) மற்றும் உவர்தன்மை (12ppt) போன்ற இனப்பெருக்க வாழ்விடங்களில் உள்ள பௌதீக,இரசாயனவியல் அளவீடுகளுடன் குறிப்பிடத்தக்க நேர்மறையான தொடர்பைக் ($p < 0.05$) காட்டியது.படகில் காணப்பட்ட உவர்தன்மையான நீரில் (10ppt) அதிகபட்சம் Aedes aegypti குடம்பிகள் பதிவாகியுள்ளன. Aedes albopictus குடம்பிகள் மட்டக்களப்பு குளத்தின் ஓரத்தில் உள்ள சிறிய நீர்க்குளங்களில் 7 ppt (அதிகபட்சம்) உவர்தன்மையுடன் பதிவாகியுள்ளன. உவர்சகிப்புத்தன்மை பற்றிய ஆய்வுகூட ஆய்வில் இருந்து பெறப்பட்ட முடிவுகளின்படி, Aedes இனங்கள் இரண்டும் 18 ppt உவர்சகிப்புத்தன்மையைக் காட்டின. மட்டக்களப்பு மாவட்டத்தில் பெரும்பாலும் காணப்படும் அதிக உவர்தன்மை கொண்ட நீரில் டெங்கு நோய் பரப்பும் நுளம்புகள் இனப்பெருக்கம் செய்யக்கூடியவை என இந்த ஆய்வில் கண்டுபிடிக்கப்பட்டுள்ளது. மாவட்டத்தில் அதிக டெங்கு நோயாளர்கள் பதிவாகுவதற்கு இதுவே காரணமாக இருக்கலாம். இவ் ஆய்வானது டெங்கை பரப்பும் நுளம்புகளின் இனப்பெருக்கம் செய்யும் சூழலியல் பற்றிய அறிவை வழங்க உதவும்.

*shashikalakeshani64@gmail.com

918/D

Do migratory waterbirds bring parasitic diseases to Sri Lanka?

[1] C. S. Sepalage, [1] W. B. Yapa, [1] P.N. Dayawanse, [1] S. S. Seneviratne,[2] A. Nitsche, and [1] I. C. Perera*

[1]Department of Zoology and Environment Sciences, Faculty of Science, University of Colombo, Sri Lanka, [2]Centre for Biological Threats and Special Pathogens: ZBS1, Highly pathogenic viruses, Robert Koch Institute, Germany

Mannar is a place with rich bird diversity in Sri Lanka. Many migratory birds come to Sri Lanka during the migratory season from August to April to avoid the harsh environmental conditions in their native countries. These migrants closely associate with the resident animals during their stay in Sri Lanka by sharing the same roosting and foraging habitats such as forests and water bodies. Ducks, Gulls, and Flamingos are the common aquatic migratory birds found in Mannar. These birds arrive from the far east, north, and central Asian countries covering the central Asian flyway. Due to the different origins, these migrants can carry many infections posing a threat to resident animal where they land. A research team from the University of Colombo, jointly with the Robert Koch Institute, Germany initiated a project to identify these parasitic infections from December 2021 to March 2022. We collected bird droppings to identify parasites in the gut of the migratory water birds. Samples were analyzed at the IDEA Laboratory, Department of Zoology and Environment Sciences at University of Colombo. Capturing and handling of birds were done by a trained ornithologist. Finally, we have identified several parasites that can cause infections in many animals, including humans. For example, duck samples analyzed were positive for parasitic worms which can cause diarrhea, nausea, anemia, seizures, and weight loss. Resident and farm animals could easily get infected by associating infected environments. It is important to continuously survey the parasites that the migratory waterbirds carry into our country to see whether there's a real threat posed by them on our native wildlife.

*icperera@sci.cmb.ac.lk

Section E1

501/E1

රාමන් වර්ණාවලීක්ෂණය මගින් ග්ලූකෝස් සංවේදනය සඳහා තඹ (copper) මූලික කරගත් උපස්ථරයක්
(SERS) ගොඩනැගීම

එල්.ඒ.ජී.ඩී.ජයසේකර,[1] කේ.ඩී.ආර්.එන්.කළුබෝවිල, [1,2] ජේ.එල්.කේ.ජයසිංහ, [1,2] එච්.එච්.ඊ.ජයවීර,[1]
එම්.එස්.ගුණවර්ධන,[1] ඩී.පී.දිසානායක,[3], ජේ.කේ.ඩී. එස්.ජයනෙත්ති,[1,2]*
[1]උපකරණ සංවර්ධන මධ්‍යස්ථානය, භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
[2]උපකරණ සහ ස්වයංක්‍රීය තාක්ෂණ දෙපාර්තමේන්තුව, තාක්ෂණ පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
[3]රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

ලාභදායි බව හේතුවෙන් රාමන් වර්ණාවලීක්ෂණය මගින් ද්‍රව්‍ය සංවේදනය කර ගැනීමට තඹ යොදා ගැනීම කෙරෙහි මෑත කාලයේ වැඩි අවධානයක් යොමුව ඇත. මෙහිදී පළමුව තඹ ඔක්සයිඩය විද්‍යුත් විච්ඡේදනය මගින් ටයිටේනියම් මත ස්ථරනය කර පසුව ඇස්කෝර්බික් අම්ලය මගින් අර්ධව ඔක්සිහරණය කර තඹ හා තඹ ඔක්සයිඩය සහිත උපස්ථරයක සාදාගන්නා ලදී. මෙසේ සදාගන්නා ලද උපස්ථරය මත ග්ලූකෝස් හි රාමන් සංඥාවේ වර්ධනය වීම සාමාන්‍ය ටයිටේනියම් තහඩුවට සාපේක්ෂකව 16.0 ± 0.2 තරම් සැලකිය යුතු අගයක් ගනී. මෙය ඍජුව විද්‍යුත් විච්ඡේදනය කරන ලද තඹ වලට සාපේක්ෂකවද සැලකිය යුතු වර්ධනය වීමකි. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ අංශුවල ක්‍රමවත් සැකැස්ම හා ඝනක හැඩැති ව්‍යුහයයි. එබැවින් මෙම තඹ හා තඹ ඔක්සයිඩය සහිත උපස්ථරය, රාමන් වර්ණාවලීක්ෂණය මගින් ග්ලූකෝස් සංවේදනය සඳහා හැකියාවක් පෙන්නුම් කරන අතර, ඉදිරියේදී මෙය ප්‍රායෝගික භාවිතය සඳහා යොදාගත හැකි මට්ටමට දියුණු කිරීමට බලාපොරොත්තු වේ.

*sumedhajayanetti@gmail.com

502/E1

පූරක අන්තර්ගතය වෙනස් කිරීම මඟින් දෘඪතාවය ඉහළ ටයර් - ට්‍රෙඩ් සංයෝගයක් ගොඩනැගීම

R.K.W.B.වික්‍රමරත්න,[1] W. වසන්ති P. ද සිල්වා[1]*
[1]භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව, ව්‍යවහාරික විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ටයර් - ට්‍රෙඩ් සඳහා භාවිත කරනු ලබන අමුද්‍රව්‍යවල බලපෑම මඟින් වාහනවල ලාක්ෂණික ගතිගුණ වන පාලනය කිරීම, පෙරළීමේ ප්‍රතිරෝධය, ඉන්ධන කාර්යක්ෂමතාවය, ටයර්වල කල්පැවැත්ම, ශබ්දය හා ගැස්සීම යනාදිය වෙනස් වේ. දෘඪතාවය මඟින් ටයරයක් සඳහා ගෙවීයාම අඩු වීම, සිදුරු වීම අවම වීම, කැපීම අඩු වීම, හා සීරීම් අවම වීම සිදුවේ. කාර්මික ක්ෂෙත්‍රයේ දී ටයර්වල දෘඪතාවය මැන බැලීම සඳහා ඩියුරෝ මීටරය (shore A) නම් උපකරණය භාවිත වේ. මෙම අධ්‍යනය මඟින් ටයරයක් සඳහා නව දෘඪ ටයරයක අගයක් ට්‍රෙඩ එක සඳහා වූ සංයෝගයක්, දෘඪතාවය 80-85 අතර අගයක් වන ලෙස ගොඩනගා එමඟින් භෞතික ලාක්ෂණික වන විශිෂ්ඨ ගුරුත්වය, ආතන්‍ය හැකියාව,දෘඪබව, පොළා පැනීමේ හැකියාව හා ගෙවීයෑමේ ස්වභාවය අධ්‍යනය කෙරේ. මෙහිදී පූරක ප්‍රමාණය වෙනස් කිරීම මඟින් දෘඪතාවය ඉහළ නංවාගැනීම සිදුකරනු ලබයි. Carbon block සහ silica යනාදිය පූරක අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරනු ලබයි. නමුත් carbon block භාවිතය මඟින් ඉහළ පෙරළීමේ ප්‍රතිරෝධයක් හා පිළියළ කිරීමේ ගැටළු තිබේ. එබැවින් දෘඪතාවය ඉහළ නැංවීමේ පූරක වශයෙන් සිළිකා භාවිත කෙරේ. සිළිකා භාවිතය මඟින් සුවිශේෂී ලාක්ෂණික වන අඩු පෙරළීමේ ප්‍රතිරෝධය, ඉහළ ගෙවීයාමේ ප්‍රතිරෝධය, ඉහළ ග්‍රහණ හැකියාව සහ ඉහළ බරක් දරා ගැනීමේ හැකියාව ලබා දේ. සිළිකා අන්තර්ගතය 40 phr සිට 80 phr දක්වා වෙනස් කරමින් විවිධ ටයර් ට්‍රෙඩ් සංයෝගය පිළියළ කරන ලදි. වඩාත් ප්‍රශස්ථ ගතිගුණ ලබාගත හැකිවූයේ 70 phr සිළිකා සමඟ ස්වභාවික හා කෘත්‍රිම රබර් මිශ්‍රණයෙනි. මෙහිදී shore A දෘඪතා අගය 82, පොළා පැනීම 439 ක් සහ ආතන්‍ය මාපාංකය 300% ද, ඇදීමේ හැකියාව 166.94 $kgcm^{-2}$ විය. එමෙන්ම ආතන්‍ය ශක්තිය 226.83 $kgcm^{-2}$ ද, කැඩීයාමට පෙර උපරිම ඇදීම් අගය 423% ද, වේ. සාර්ථක ටයර් ට්‍රෙඩ් එකක් ස්වාභවික හා කෘත්‍රිම රබර් සමඟ 70 phr silica සමඟින් පිළියළ කරන ලදි. ප්‍රශස්ථ සංයෝග සමඟින් ටයරයක් නිෂ්පාදනය කළ අතර දරාගැනීම් පරීක්ෂණය සිදුකරන ලදි. මෙහිදි වි.350 ධාවන කාලයේ දී අඩු තාප නිර්මාණය විය. මෙවන් ටයර් කාර්මික කටයුතු වන පතල් වැඩ හා ට්‍රක් රථ වැනි රළු පාරවල් සඳහා භාවිතා කළ හැකිය.

*wasanthidesilva@sjp.ac.lk

503/E1

ස්වභාවිකව පවතින සුපිරි ජලභීතික පෘෂ්ඨ වල මතුපිට තෙත් බව ශ්‍රී ලංකාවේ භූගෝලීය ස්ථාන අනුව වෙනස් වන ආකාරය විමර්ශනය කිරීම

ඩබ්ලිව්.ඩී.ජී.එම්. සේනාරත්න[1]*, එස්.ජයවර්ධන[1]
[1]භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ

ස්වභාවික සුපිරි ජලභීතික ද්‍රව්‍ය සම්බන්ධයෙන් සෑම වසරකම පර්යේෂණ පත්‍රිකා අතිවිශාල ප්‍රමාණයක් ඉදිරිපත් වේ. එසේ වුවද, මෙම සුපිරි ජලභීතික පෘෂ්ඨ හරහා ජල ස්පර්ශක කෝණය පිළිබඳ බොහොමයක් පර්යේෂණ සොයාගැනීම් අතර විෂමතා පවතී. එබැවින්, මෙම ප්‍රතිඵල සෘජුවම සංසන්දනය කිරීම හෝ ප්‍රතිනිෂ්පාදනය කිරීම සිදු කළ නොහැකි ය. මෙම විෂමතාවයට එක් හේතුවක් ලෙස ස්පර්ශක කෝණවල අගය මැනීම සඳහා ප්‍රමිතියෙන් යුතු නිශ්චිත ක්‍රියා පටිපාටියක ඌනතාවය හේතු විය හැකි අතර නියැදි පෘෂ්ඨය තුළ සහ ඒවා අතර ඇති ස්වභාවික විචල්‍යතාවය ද ජල ස්පර්ශක කෝණවල අපගමනයට දායක විය හැකිය. මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ හබරල (*Colocasia esculenta*), නෙළුම් (*Nelumbo nucifera*), කැනා (*Canna coccinea*) ශාක වල පත්‍ර සහ රෝස (*Rosa*) මලෙහි පෙති නියැදි පෘෂ්ඨ ලෙස යොදා ගෙන එම තෝරා ගත් පෘෂ්ඨ මත තැබූ ජල බිංදුවක හැඩය විශ්ලේෂණය කිරීමේ ක්‍රමවේදයක් භාවිතා කර ජල ස්පර්ශක කෝණය නිරවද්‍ය ලෙස මැන බැලීමෙන් තෝරා ගත් එක් එක් දිස්ත්‍රික්කවලින් ලබා ගත් නියැදි පෘෂ්ඨයන්හි ජල ස්පර්ශක කෝණ අතර ඇති ස්වභාවික විචල්‍යතාව පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමයි. ඒ සඳහා ගම්පහ, කොළඹ, කෑගල්ල, අනුරාධපුර සහ මාතලේ දිස්ත්‍රික්ක වලින් නියැදි පෘෂ්ඨයන් සපයා ගෙන ජල ස්පර්ශක කෝණය මැනීම සිදු කරන ලදී.

වඩාත් ප්‍රචලිත සුපිරි ජලභීතික පෘෂ්ඨය වන නෙළුම් පත්‍රයේ ජල ස්පර්ශක කෝණය 157.6° $\pm$ 0.7° සිට 164.1° $\pm$ 0.4° දක්වාද රෝස මල් පෙත්තේ ජල ස්පර්ශක කෝණය 141.2° $\pm$ 2.9° සිට 160.9° $\pm$ 0.6° දක්වාද විචලනය විය. මීට අමතරව, හබරල පත්‍රයේ ජල ස්පර්ශක කෝණය 153.4° $\pm$ 1.8° සිට 160.3° $\pm$ 1.5°දක්වාද කැනා පත්‍රයේ ජල ස්පර්ශක කෝණය 144.0° $\pm$ 3.2° සිට 161.5° $\pm$ 2.3° දක්වාද විචලනය විය. මෙහිදී ලබා ගත් අගයන් මීට පෙර වාර්තාගත අගයන් සමග ගැලපෙන බැවින් විවිධ භූගෝලීය ස්ථාන හරහා පවතින දේශගුණික අනුගතවීම් හේතුවෙන් මෙම නියැදි පෘෂ්ඨයන්හි සුපිරි ජලභීතික ලක්ෂණ වල සැලකිය යුතු වෙනසක් ඇති විය හැකි බව පෙනෙන්නට තිබුණි. ඊට අමතරව තෝරාගත් ස්වභාවික සුපිරි ජලභීතික පෘෂ්ඨවල නැනෝ/ක්ෂුද්‍ර ව්‍යුහයන් අධ්‍යයනය කිරීම සඳහා ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂීය ඡායාරූප ලබා ගන්නා ලදී.

*madhushanisenaratna96@gmail.com

506/E1

සුහුරු ජංගම දුරකතන හඬ ආබාධ හඳුනාගැනීම සඳහා සුදුසුද?

උදිත වීරසිංහ සහ රමාල් වී. කුරේ

භෞතික විද්‍යා අංශය, කොළඹ විශ්වවිද්‍යාලය

වර්තමානයේ සන්නිවේදන සඳහා බොහෝදෙනා සුහුරු ජංගම දුරකතනය භාවිත කරති. හොඳ සන්නිවේදනයක් සඳහා හොඳ ස්වර සෞඛ්‍යයක් පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය අතර, උගුර නාසය ආශ්‍රිත රෝග වැළඳීම හේතුකොට ස්වර තන්තු වලට හානි වීම නිසා මිනිස් කටහඬ විවිධ වෙනස්වීම් වලට භාජනයවේ. මිනිස් කටහඬේ වෙනස්වීම් අධ්‍යයනය කිරීම සඳහා මෙම පර්යේෂණයේදී, ශබ්ද පාලන මැදිරියක, සම්මත මයික්‍රෆෝනයකින් ලබාගත් හඬ පරාමිතීන්වලට සාපේක්ෂව ඇන්ඩ්‍රොයිඩ් සුහුරු ජංගම දුරකතනයකින් ලබාගත් හඬ පරාමිතීන් විශ්ලේෂණය කරනලදී. මෙම අධ්‍යයනයේදී, පුද්ගලයන්ගේ /අ:/, /ඉ:/, සහ /උ:/ යන ස්වර ශබ්ද 3 හි හඬ සාම්පල වලට අනුරූප ඉහළ, සාමාන්‍ය සහ පහත් තාරතා (pitch) මට්ටම් 3කින් ලබාගන්නා ලදී. පර්යේෂණයේ ප්‍රතිඵලවලට අනුව, පහත් තාරතා සාම්පල සඳහා විශිෂ්ට සහසම්බන්ධතා (co-relation) අගයන් සැපයූ අතර සුහුරු ජංගම දුරකතන හඬ ආබාධ හඳුනාගැනීම සඳහා සුදුසු බව තහවුරු විය. තවද, විශ්ලේෂණය කරන ලද හඬ පරාමිතීන් 5 න් 3 ක් මයික්‍රොෆෝනය සහ ජංගම දුරකථන අතර ඉතා හොඳ සහසම්බන්ධයක් පෙන්නුම්කරන ලදී.

*ramal@phys.cmb.ac.lk

508/E1

ඉගැන්වීමේදී ගණිත ගුරුවරුන් සිසුන්ගේ පෙර දැනුම සක්‍රිය කරන්නේ කෙසේද?

ඩී. ආර්. එන්. එන්. රත්නායක සහ ජී. එන්. ජයකොඩි

ඔබගේ පෙර දැනුම, නව ඉගෙනුමක් සඳහා කෙසේ වැදගත් වේද? සරල උදාහරණයක් ලෙස ත්‍රිකෝණයක වර්ගඵලය සෙවීමට පළමුවෙන්ම ඉගෙන ගන්නා මොහොත සලකමු. මෙහිදී සෘජුකෝණාශ්‍රයක වර්ගඵලය සෙවීමේ පෙර දැනුම සක්‍රිය කිරීමෙන් හා ත්‍රිකෝණයක් යනු සෘජුකෝණාශ්‍රයකින් අඩක්ය යන සම්බන්ධය දැකීමෙන් ත්‍රිකෝණයක වර්ගඵලය සෙවීමේ මූලික සූත්‍රය ඔබට ඉතා පහසුවෙන් ඉගෙන ගත හැක. මෙහිදී සිදුවන්නේ පෙර දැනුම, නව දැනුම සමඟ සම්බන්ධ කිරීමෙන් තොරතුරු සංජානනය පහසුවී ඉගෙනීම වේගවත් වීමයි. එමඟින් තොරතුරු උකහා ගැනීමේ හා මතක තබා ගැනීමේ කාර්යක්ෂමතාවය වැඩිවේ. තවද පෙර දැනුම සක්‍රිය කිරීම තුලින් පසුගිය පාඩම් වලට අදාලව සිසුන්ගේ දක්ෂතා, දුර්වලතා හා වැරදි අවබෝධ හඳුනා ගැනීම ගුරුවරයාට හැකිය. පෙර දැනුම, සාර්ථක ඉගෙනීමක ප්‍රධානතාම සාධකයක් බව පර්යේෂණ වලින් තහවුරු කර ඇත.

සීමාව කලනයේ මූලික සංකල්පයකි. නමුත් එහි සංකීර්ණභාවය හේතුවෙන් බොහොමයක් සිසුන් සීමාවෙහි සංකල්පීය දුර්වලතා පෙන්වයි. සීමාව හැදෑරීම සඳහා ශ්‍රිත, එහි අංකනය, වසම, පරාසය, තාත්වික සංඛ්‍යා, ප්‍රස්ථාර, අනන්තය සංකල්පය යනාදී විෂය කොටස්වල පූර්ව දැනුම අත්‍යවශ්‍ය වන අතර එහි මතකය අවදි කර, එම පෙර දැනුම හා සම්බන්ධ කරමින් නව දැනුම ඒ මත ගොඩ නැගීම, සංකල්පීයව ඉගෙන ගැනීමට පිටුවහලක් වේ. මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වනුයේ උසස් පෙළ ගණිත ගුරුවරුන් ශ්‍රිතයක සීමාව ඉගැන්වීමේදී සිසුන්ගේ ශ්‍රිත පිලිබඳ පෙර දැනුම සක්‍රිය කිරීමට ගත් ක්‍රමෝපායන් විශ්ලේෂණය කිරීමයි. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක තුනක පිහිටි පාසල් නවයක ගුරුවරු දොළහකගේ සීමාව අර්ථ දැක්වීමට අදාළ පාඩම් පරිච්ජේද දෙක බැගින් නිරීක්ෂණය කර, ඒවා පටිගත කර පිටපත් කිරීමෙන් හා ගුණාත්මකව විශ්ලේෂණය මගින් ගුරුවරු පෙර දැනුම සක්‍රිය කිරීමට ගත් ප්‍රවේශ නිර්ණය කරන ලදී.

විශ්ලේෂණයන්ට අනුව, ගුරුවරුන් ශ්‍රිත පිලිබඳ උදාහරණ, ක්‍රියාකාරකම් හා සාකච්ඡා තුලින් ශ්‍රිත අංකනය, වසම, පරාසය, දෙන ලද X අගයකට අදාලව ශ්‍රිතයේ අගය සෙවීම, අනන්තය, පරිමිත ශ්‍රිත හා ප්‍රස්ථාර සම්බන්ධව සිසුන්ගේ පෙර දැනුම සක්‍රීය කිරීමට යම් උත්සාහයන් ගන්නා බව පැහැදිලිය. සුළු පිරිසක් ශ්‍රිත ආවර්ජනයෙන් පසු යම් දෙන ලද ලක්ෂ්‍යයකදී ශ්‍රිතයක අගය හා සීමාව පිලිබඳ වෙනස පැහැදිලි කර එම පාඩම් අතර පැහැදිලි

සම්බන්ධයක් ආරම්භයේදීම ගොඩ නැගීය. නමුත් සමහරක් ගුරුවරුන්ගේ සම්ප්‍රදායික ඉගැන්වීම් රටාව හේතුවෙන් ශ්‍රිත පිලිබඳ ආවර්ජනයට අවකාශයක් නොතිබුණු අතර සීමාවෙහි සංකීර්ණ කරුණු මුල සිටම ඉගැන්වීම සිදුවිය. මෙම විශ්ලේෂණය තුලින්, සිසුන්ගේ පෙර දැනුම සක්‍රීය කිරීම සඳහා ගණිත ගුරුවරුන් විශේෂ අවධානයක් යොමු කල යුතු බව පැහැදිලි වේ. ඒ සඳහා විවිධ වූ සාකච්ඡා, ක්‍රියාකාරකම, පැවරුම් හා ඉදිරිපත් කිරීම් භාවිතා කිරීමට ඔවුන්ට පුහුණුවක් අවශ්‍ය වන අතර ගුරු වෘත්තිය සංවර්ධන වැඩසටහන් හා වැඩමුළු ඵලදායි කිරීම සඳහා මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල භාවිතා කල හැක.

*rovininr@gmail.com

510/E1

කෘතිම බුද්ධිය මත පදනම් වූ කොටස් වෙළඳපළ දර්ශකයක් නිර්මාණය කිරීම

එල්.ඩී.එස්.ඩිල්ෂාන්[1]*, ඊ.ආර්.ඒ.ඩී.බණ්ඩාර[1]
[1]සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය

ඕනෑම රටක කොටස් වෙළඳපළ යනු ඉතා වැදගත් මූල්‍ය වෙළඳපළකි. ඒවායේ කාර්ය සාධනය තක්සේරු කිරීමට කොටස් වෙළඳපළ දර්ශක භාවිත වේ. කොටස් වෙළඳපළ දර්ශකයක ඇති වටිනාකම නිසා වසර ගණනාවක සිට පර්යේශකයන් තම අවධානය ඒ වෙත යොමුකර ඇත. කෘතිම බුද්ධිය යනු වසර ගණනාවක සිට නැගී එන ක්ෂේත්‍රයක් වන අතර එහි දියුණුව සෑම ක්ෂේත්‍රයකටම පාහේ බලපෑම් එල්ල කර ඇත. කෘතිම බුද්ධිය ද පර්යේශකයන් අතර ආකර්ශණීය මාතෘකාවකි. වසර ගණනාවක සිට පර්යේශකයන් කෘතිම බුද්ධිය, කොටස් වෙළඳපළට හා කොටස් වෙළඳපළ දර්ශක සඳහා යොදාගැනීමට උනන්දුවනු දැකිය හැක. නමුත් කෘතිම බුද්ධිය මත පදනම් වූ කොටස් කොටස් වෙළඳපළ දර්ශකයක් සැකසීම පිළිබඳ සාක්ෂි හමුනොවේ. එබැවින් කෘතිම බුද්ධිය මත පදනම් වූත් ශ්‍රී ලංකාව තුල භාවිතයට ගන්නා කොටස් වෙළඳපළ දර්ශකයන්හි දුර්වලතා මගහැරිය හැකි වූත් කොටස් වෙළඳපළ දර්ශකයක් සැකසීම සඳහා මෙම පර්යේශණය සිදුකරන ලදී. පර්යේශණය සඳහා 2012-2020 අතර කාලය යොදා ගන්නා ලද අතර, එම කාලය තුල කොටස් වෙළඳපළ දර්ශක වලට මූල්‍ය කටයුතු පිළිබඳ පුවත් වලින් බලපෑමක් ඇති බව හඳුනාගන්නා ලදී. එබැවින් මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රවෘත්ති සඳහා කෘතිම බුද්ධිය හා තාත්වික භාෂා සැකසීකම් තාක්ෂණය (NLP) භාවිතයෙන් මත විශ්ලේෂණයක් (Sentiment Analysis) සිදුකරන ලද අතර එම ප්‍රතිඵල භාවිතයෙන් කොටස් වෙළඳපළ දර්ශකයක් සකසන ලදී. මත විශ්කල්ෂණයේදී වඩා හොඳ ප්‍රතිඵල සඳහා දිගු-කෙටි කාලීන මතක (LSTM) ජාල භාවිත කරන ලද අතර එහි නිරවද්‍යතාව 72% විය. නව දර්ශකය (සමීකරණය 1) වෙළඳපළ ප්‍රොග්ධනීකරණය මත දනම් වූ දර්ශකයක් වූ අතර අවශය සියලුම වෙනස්කම් හා ගැලපීම් අවශ්‍ය අවස්ථා වලදී යොදන ලදී. කොළඹ කොටස් වෙළඳපළේ දැනට පවතින සියලුම කොටස් මිල් දර්ශක වල අවාසි මඟහරවා ගැනීම සඳහා නව දර්ශකය නිදහසේ පාවෙන කොටස් (Free Float Shares) භාවිතයෙන් සකස් කරන ලදී. වෙළඳපළ ප්‍රාග්ධනීකරණය පමණක් භාවිතා කරනවා වෙනුවට, මත විශ්ලේෂණයේ ප්‍රතිඵලත්, දින දෙකක් තුල වෙළඳපළ ප්‍රාග්ධනීකරණයේ වෙනසත් මිල් දර්ශකය සැකසීමේදී භාවිතා කරන ලදී. නව මිල දර්ශකය, මිල් දර්ශකය මත වූ ප්‍රතිලාභය (ROI) ඇසුරෙන් ඇගයීමට ලක්කරන ලද අතර අදාල කාලය සඳහා 13% ප්‍රතිලාභයක් නව මිල දර්ශකය මගින් ලබා දෙන ලදී. එය දෙවෙනි වූයේ 35% වූ සමස්ත කොටස් මිල දර්ශකයේ ප්‍රතිලාභයට පමණි. නමුත් බොහෝ වසර වලදී වැඩිම ප්‍රතිලාභය නව මිල දර්ශකය මගින් ලබා දී තිබුණි.

$$New\ Index=(M+(s\times m\times f)\ )\ /\ divisor$$

M = නිදහස් කොටස් මත වූ වෙළඳපළ ප්‍රාග්ධනීකරණය
s = මත විශ්ලේෂණයේ ප්‍රතිඵල (+1 ධනාත්මක, -1 ඍණාත්මක, 0 උදාසීන මත සඳහා)
m = මත විශ්ලේෂණයේ ප්‍රතිඵල් මත පදනම් වූ වෙළඳපළ ප්‍රාග්ධනීකරණයේ සාමාන්‍ය අගය
f = දින කදකක් තුල් සිදු වෙළඳපළ ප්‍රාග්ධනීකරණයේ අවම අගය / දින කදකක් තුල් සිදු වෙළඳපළ ප්‍රාග්ධනීකරණයේ උපරිම අගය

*sachinthadilshan96@gmail.com

Section E2

624/E2

දියර කිරි හා පිටි කිරි තුල ඩී.සී.ඩී රසායනිකය තිබේදැයි හඳුනාගැනීමට පහසු ක්‍රමයක්

බී.එස්.ඩබ් කරුණාරත්න *[1], එම්.ජ්.බී ප්‍රශාන්ත[2], එන්.ජී.ඩී.ඩී නානායක්කාර[2], ඩී.සී.කේ.කේ දිසානායක[3]

[1] රසායන විද්‍යා අංශය, විද්‍යා පීඨය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.
[2] රසායන විද්‍යා අංශය, ව්‍යවහාරික විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.
[3] ජීවන විද්‍යා අංශය, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, වැල්ලම්පිටිය, ශ්‍රී ලංකාව.

ඩයිසයන්ඩයිඇමයිඩ් (Dicyandiamide) හෙවත් DCD යනු මෑතකදී ආනයනය කරන ලද කිරිපිටි තුල අංශුමාත්‍ර වශයෙන් අඩංගු වී හඳුනාගත් රසායනිකයකි. DCD පරිභෝජනය තුළින් මිනිසාට සිදුවන බලපෑම පිළිබඳව ප්‍රමාණවත් පර්යේෂණ සිදු කෙරී නොමැති අතර DCD කිරිපිටි තුල අඩංගු විය හැකි ප්‍රමාණයන් පිළිබඳව අන්තර්ජාතිකව එකඟතාවයකටද පැමිණ නොමැත. එසේ වුවද අප පරිභෝජනය කරනු ලබන කිරි ආශ්‍රිත අහාර බාහිර රසායනකයන්ගෙන් තොර බව සහතික කිරීම අත්‍යවශ්‍ය කරුණකි. පොහොරක් ලෙස තණබිම් වලට DCD භාවිතා වන අතර ගවයන් මෙම තණබිම් මත යැපීමෙන් පසුව DCD ශරීර ගත වී අවසානයේ අංශුමාත්‍ර ලෙස අප පරිභෝජනය කරනු ලබන කිරි තුල අඩංගු විය හැකි බවට සැක කෙරේ. DCD රසායනිකය තුල අඩංගු අධික නයිට්‍රජන් ප්‍රතිශතය නිසා කිරි නියදියේ තිබෙන ප්‍රෝටීන් ප්‍රමාණයට වඩා වැඩි ප්‍රෝටීන් ප්‍රමාණයක් තිබේ යැයි ව්‍යාජ ලෙස නිර්ණය විය හැක. එය පාරිභෝගිකයන් නොමගයන සුලු තොරතුරකි. දැනට කිරි වල අඩංගු DCD හඳුනාගැනීමට ප්‍රධාන රසායනික විශ්ලේෂණ ක්‍රම කිහිපයක් පවතින අතර ඒවා බොහොමයක පිරිවැය ඉතා ඉහළය. එමෙන්ම ඒ සඳහා ඉහල තාක්ෂණික හැකියාවක් සහිත පර්යේෂණාගාර පහසුකම්ද අවශ්‍ය වේ. මෙම අධ්‍යනයේදී අප මෙම ගැටළු මගහරවාගැනීමට සාපේක්ෂව අඩු වියදමක් සහිත හා භාවිතයට පහසු FTIR වර්ණාවලිය (Fourier-transform infrared spectroscopy) යොදා ගනිමින් විශ්ලේෂණාත්මක ක්‍රමවේදයක් ඉදිරිපත් කොට ඇත. මෙම අධ්‍යනයේදී DCD අඩංගු කිරි වල අධෝරක්ත වර්ණාවලීයේ සිදුවන වෙනස උපයෝගී කරගනිමින් DCD හඳුනාගැනීම සිදු කෙරේ. එමෙන්ම එම වෙනසේ තීව්‍රතාවය අනුව DCD අඩංගු වන ප්‍රමාණය හඳුනා ගැනීමද සිදු කෙරේ. මේ සඳහා ප්‍රස්තාරික ක්‍රමයක් යොදාගෙන ඇති අතර මෙම ක්‍රමයේ නිරවද්‍යතාවය පරික්ෂා කිරීම සඳහා, දන්නා ප්‍රමාණවලින් DCD කලවම් කරන ලද දේශීය දියර කිරි, සහ කිරිපිටි සාම්පල යොදා ගැනුණි. මෙම ක්‍රමය භාවිතා කොට, 0.49 mg/ml වැනි අවම සාන්ද්‍රණ සීමාවක් දක්වා DCD හඳුනා ගත හැකි අතර, 1.48 mg/ml සීමාවක් දක්වා DCD අඩංගු වන ප්‍රමාණය ගණනය කල හැක. අප සිදු කල මෙම අධ්‍යයනය, කිරි කර්මාන්තයට මෙන්ම ආහාර වල ගුණාත්මකභාවය පරික්ෂා කිරීමේ නියැලී සිටින ඉදිරිපෙළ නිලධාරීන්ටද වැදගත් වනු නොඅනුමානය.

*baggya.karunarathna@gmail.com

601/E2

ආයෙත් ගෙදර දී හොරෙන් සිගරට් බොන්න බැරි වෙයි..

සිගරට් දුම ගෘහස්ථව හඳුනා ගැනීමට පහසු නව ක්‍රමයක්.

W.M.D.A. වාසලමුදලි, K.R.R. මහානාම*

රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය, කොළඹ 03.

දුම්පානය ශරීර සෞඛ්‍යයට බෙහෙවින් අහිතකර වේ. මෙහි අහිතකර බලපෑම දුම්පානය කරන තැනැත්තාට, එනම් සක්‍රීය දුම්පානය කරන්නාට පමණක් සීමා නොවී ඔහු වටා සිටින පුද්ගලයන්ට ද, එනම් අක්‍රීය දුම්පානයේ ගොදුරු බවට පත්වන්නන්ට ද ඒ හා සමාන බලපෑමක් ඇති කරයි. එබැවින් දුම්පානය ගෘහස්ථව සිදු කෙරෙන එක් ප්‍රධාන ම වායු දූෂණ මාධ්‍යයක් ලෙස පර්යේෂකයින් විසින් හඳුනා ගෙන ඇත. ස්වසන ආබාධ, පිළිකා තත්ව ආදී දරුණු රෝගාබාධ හැරුණු විට දිගු කාලයක් පුරා දුම්වැටි භාවිතා කිරීමේ තවත් එක් අඳුරු පැතිකඩක් ලෙස එයට ඇබ්බැහි වීම හඳුනා ගත හැක. මෙම ඇබ්බැහි වීමට ප්‍රධාන ම හේතුව වන්නේ නිකොටීන් නැමැති සංඝටකයයි. බොහෝ දෙනෙකු දුම්පානය කරන්නේ ද දුම්කොළෙහි පමණක් අන්තර්ගත නිකොටීන් නම් මෙම රසායන ද්‍රව්‍ය නිසාය. එමඟින් මනස උත්තේජනය කරන බව විද්‍යාත්මකව සොයා ගෙන ඇත. එම නිසා දුම්බීම පුරුද්දක් කර ගත් බොහෝ දෙනාට එය මඟ හැර ගැනීමට අපහසු වී ඇත. ඉහත දක්වන ලද සියලු ම කරුණු සැලකිල්ලට ගත් විට දුම්පානයට ඇබ්බැහි වීමට ප්‍රථමයෙන් ම අයෙක් එයින් අත් මුදවා ගැනීම, දුම්වැටි භාවිතය නැවැත්වීමට ගත හැකි වඩාත් ම ප්‍රායෝගික පියවර බව පෙනී යයි. එසේ නම් අපගේ මූලික අවධානය යොමු විය යුත්තේ පාසල් වයසේ දරු දැරියන් සහ නව යොවුන් වියේ පසු වන්නන් මෙම අහිතකර පුරුද්දට ඇබ්බැහි වීම නවත්වා ගැනීම කෙරෙහි වේ. එම අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් අපගේ පර්යේෂණයේ එක් මූලික ම අරමුණක් වශයෙන් දෙමාපියන් හට තම දරුවන් දුම්පානයේ යෙදෙන්නේ ද නොයෙදෙන්නේ ද යන්න සැක හැර දැන ගැනීම සඳහා නිවසේ දී භාවිතා කළ හැකි සරල ක්‍රමවේදයක් හඳුන්වා දීමට අපි අදහස් කළෙමු. සිගරට් දුමට එයට ම ආවේණික වූ දුර්ගන්ධයක් පැවතිය ද මෙම දුර්ගන්ධය මඟහරවා ගැනීමේ විවිධ ක්‍රම දරුවන් භාවිතා කරන බැවින් එමඟින් දුම්පානය කරන්නන් හඳුනා ගැනීමේ අපහසුතාවක් පවතියි. එම නිසා දුගඳක් නොමැති වුව ද දුම්වැටි භාවිතා කර තිබේ ද නැද්ද යන වග හඳුනා ගැනීම සඳහා සිගරට් දුමෙහි පමණක් අඩංගු නිකොටීන් නිරීක්ෂණය මත පදනම් වූ අපගේ නව ක්‍රමයට හැකියාව පවතියි. වැඩිදුර පර්යේෂණ මගින් එය නිකොටීන් සංවේදී පද්ධතියක් දක්වා වැඩි දියුණු කිරීම අපගේ අභිලාෂයයි. මෙවැනි පද්ධතියක් මඟින් යෞවනයන් දුම්පානය කිරීම අධෛර්යමත් කිරීමත් කුඩා කල ම දුම්පානය වැළැක්වීම තුළින් නිරෝගීමත් ජාතියක් ගොඩ නැගීම සඳහා සුළු හෝ දායකත්වයක් ලබා දීමත් අපගේ අභිප්‍රායයි.

*maha@chem.cmb.ac.lk

602/E2

Hidden evils in paddy fields

I.M.A.K. Karunasena[1], S.M. Vithanarachchi[1]*, M. R. Wijesinghe[2] and R.D. Wijesekera[1]

[1]Department of Chemistry, University of Colombo, Sri Lanka
[2]Department of Zoology & Environment Sciences, University of Colombo, Sri Lanka

Heavy metal pollution has become a topic of debate in Sri Lanka because scientists are of the view that it is one of the leading causes of the kidney disease prevalent in the Central Province of Sri Lanka. Some heavy metals such as lead and cadmium are hazardous to plants and animals even at very low concentrations, whereas others become toxic once thresholds are exceeded. A study was conducted to assess whether paddy field associated soil, water, plants and animals contain heavy metals, and if so, at what levels. The paddy fields that were selected were located in the Kurunegala district. Soil, water, tissues of plants and animals were collected from these sites and tested for lead, cadmium and zinc.

The study indicated that the soil has high levels of zinc and lead, whereas no cadmium was detected. Water spinach, which is a popular vegetable, also had high levels of both lead and zinc suggesting that consuming leafy vegetables from paddy fields would be risky for humans. Levels of the heavy metals were greater in animal tissues indicating accumulation along food chains. Heavy metal contamination in paddy fields is most likely influenced by the use of Triple Super Phosphate (TSP) and zinc sulphate ($ZnSO_4$). The levels of heavy metals recorded in the paddy fields could be detrimental to animals. It also shows that consuming paddy, other plants, and animals from such contaminated fields could also expose humans to many adverse impacts, particularly over the long term.

*sashimv@chem.cmb.ac.lk

619/E2

Tropical almond; a potential cure for gastric and urinary tract infections?

D.N. Udukala* and S.A.R. Waidyalankara

Institute of Chemistry Ceylon, College of Chemical Sciences, Rajagiriya, Sri Lanka.

Urease, an enzyme produced by various bacteria, fungi and plants, is a major factor in the development of gastrointestinal tract disorders, peptic ulcers, and urinary tract infections that can sometimes lead to stomach cancer. This is because urease enables bacteria such as *Helicobacter pylori* to survive in the acidic environment of the stomach. In plants, urease is abundant in leguminous seeds and a common bacterial urease is the *Helicobacter pylori* urease.

Urease inhibitors are useful in treating a range of serious complications brought by urease. Although antibiotic treatments can heal ulcers, prevent reappearance of peptic ulcers, and lower the risk of stomach cancer in high-risk groups, the resistance of bacteria towards these antibiotics has increased. Due to this reason and other concerns such as toxicity and undesirable side effects, although efficient antimicrobial medications are available, there is still room for improvement.

Tropical almond, also known as ‘Kottamba’, which is *native to Southeast Asia, is well known for its nutritional fruit and medicinal benefits.* It grows as a large tree in subtropical and tropical environments. Researchers have proven *that its plant parts are important for the protection against acute liver injury and microbiological infections.* Parts of the plant are also used internally to treat stomach-aches and headaches. According to Ayurveda and Siddha medicine, *all parts of the plant have been used in treating various diseases* including treatments of inflammation illnesses, wounds, allergies, skin issues, ulcers, diarrhea, and many other ailments.

